ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2015 ක් වූ ජනවාරි 18 ඉරිදා 149 වෙළුම 33 කලබ සතිපතා පත්‍රය - පිටු 28 - මිල රු. 25.00 - පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/20/NEWS/2015

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

POPE FRANCIS
Sri Lanka 2015



සේයා: සාගර ලක්මාල් / තිළිණ අලහකෝන්

# දහම් ගඟ උතුරා ගලයි !

## ගාලු මුවදොර පිටිය සහ මරද මඩු සිද්ධස්ථානය කාලයේ සළකුණු බවට පත්වේ!

## කාදිනල් හිමිපාණන්ගේ මඟ පෙන්වීමෙන් දේව විශ්වාසයේ බලය මෙරට අත්දකී



### ඥානාර්ථ ප්‍රදීපය සමඟින් සමස්ත ශ්‍රී ලාංකේය කතෝලික සැදැහැවත් ජනතාවගේ තුතිය කාදිනල් හිමිපාණන්ට පිරිනැමේ

"දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ශක්තිමත් වී බහුතර ජනතාවගේ ආධ්‍යාත්මිකත්වය සහ සංවරශීලි බව කෙරෙහි විශ්වාසයෙන් යුතුව සසුන් පිය ගමන ඉදිරියට ගෙන යා යුතුයි. ශ්‍රී ලංකාව සාමකාමී නීතිගරුක රටක් බව ලෝකයට පෙන්නන්න මෙය හොඳ අවස්ථාවක්. මේ සංචාරය සිදුවන්නේ දිව්‍යමය ආශිර්වාදය සමඟයි. දිව්‍යමය සංරක්ෂණය තුළ විශ්වාසය තබමින් දේව හස්තය තුළ යැපෙන්නට ආගමික නායකයන් ලෙස අප ශක්තිමත් නැද්ද?"

**- අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණෝ -**

(ඥානාර්ථ ප්‍රදීපය, සම්මුඛ සාකච්ඡාව 2014. 12. 21)

## සාන්තුවරයට එසැවීමේ මෙහෙයේදී ආශ්චර්යවත් ප්‍රාතිහාර්යයක්!



භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් ශුද්ධවරයට එසැවීම නිමිතිකොට ගාලුමුවදොර පිටියේ පැවති දේව මෙහෙයට ලක්ෂ හයකට ආසන්න සැදැහැවත් ජනතාවක් පෙළ ගැසීම දැස් පනාපිට ආශ්චර්යවත් ප්‍රාතිහාර්යයක් බව සැදැහැවත් ජනතාව එක හෙළා පවසති.

ශ්‍රී ලංකාවට සැපත් වූ අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ගේ උතුම් මානුෂ ගතිගුණ අගය කරන කතෝලික නොවන අන් ලබ්ධිකයින් පවා නිසොල්මන්ව සහෝදරත්වය බෙදා හදා ගත් අපූර්වත්වය නිසා ලෝක ජන මතය ද වෙනස් වී ඇති බව ප්‍රකාශ වේ.

**"සමිඳුන් උතුම්ය. උන්වහන්සේට බොහෝ පැසසුම් හිමිවිය යුතුය" (ගීතාවලිය 96: 1-4 )**

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55






# සුව කිරීමේ ක්‍රියාවලියට සත්‍යය සොයා යාමද ඇතුළත් විය යුත්තේ පැරැණි තුවාල පාරන්නට නොව යුක්තිය, සුවදානය හා එක්සත්කම වඩවන්නට අවැසි මගක් ලෙසිනි.

## කටුනායක ගුවන් තොටුපලේදී ශුද්ධෝත්තම පියතුමා පැවැත්වූ කථාව

**අතිගරු ජනාධිපතිතුමෙනි, ගරු රාජ්‍ය නිලධරයනි, අතිඋතුම් කාදිනල් හිමිපාණනි, ගරු තානාපතිවරුනි, හිතාදර මිත්‍රවරුනි,**

ඔබතුමන්ලාගේ උණුසුම් පිළිගැනීමට ස්තූතිවන්තවෙමි. ශ්‍රී ලංකාවේ මේ සංචාරය හා අප එක්ව ගත කරන මේ දිනයන් උදාවන තුරු මම ආශාවෙන් බලා සිටියෙමි. ශ්‍රී ලංකාවේ ස්වාභාවික සෞන්දර්යය නිසා 'ඉන්දියන් සාගරයේ මුතු ඇටය' යනුවෙන් හඳුන්වනු ලබයි. ඊටත් වඩා වැදගත් වන්නේ ශ්‍රී ලංකා වාසීන්ගේ ආගන්තුක සත්කාරයත්, ඔවුන්ගේ සංස්කෘතික හා ආගමික සම්ප්‍රදායන්හි ඉමහත් විවිධත්වයත් නිසා එය ප්‍රසිද්ධියට පත්වී තිබීමයි.

ගරු ජනාධිපතිතුමෙනි, ඔබතුමන්ගේ නව වගකීම් වෙනුවෙන් මාගේ උණුසුම් සුබපැතුම් පිළිගන්වමි. අප හට ගෞරවය දක්වමින් මෙහි පැමිණි රජයේ සම්භාවනීය සාමාජිකයනට හා සිවිල් බලධරයන්ට මාගේ ශුභාසිංසන පිළිගන්වමි. මෙරටේ ජන ජීවිතය අරභයා ඒ සා වැදගත් කාර්යභාරයක් ඉටුකරන, මෙහි සපැමිණි ගරු කටයුතු ආගමික නායකයින්හට මම විශේෂයෙන් කෘතඥ වෙමි. එසේම මේ චාරිකාව පහසු කරවූ සැදැහැවතුන්ටත්, ගායනා කණ්ඩායමේ සාමාජිකයන්ටත්, අනෙකුත් පුද්ගලයින් බොහෝ දෙනාටත් මාගේ ප්‍රශංසාව පුද කරන්නටද කැමැත්තෙමි. ඔබගේ කාරුණිකත්වය හා ආගන්තුක සත්කාරය වෙනුවෙන් මාගේ හද පත්ලෙන්ම ඔබ සැමට ස්තූති වන්තවෙමි.

මාගේ ශ්‍රී ලංකා සංචාරයේ මූලික වශයෙන්ම ඇත්තේ එඬේරික ස්වරූපයකි. කතෝලික සභාවේ විශ්ව එඬේරාණන් වශයෙන් මේ ද්වීපයේ කතෝලික ජනතාව හමුවන්නටත්, ඔවුන් දිරිමත් කර ඔවුන් හා යදින්නටත් මම පැමිණ ඇත්තෙමි. මේ චාරිකාවේ උච්චාවස්ථාවක් වන්නේ භාග්‍යවත් ජුසේ වාස් පියතුමන් ශුද්ධවරයට ඔසවනු ලැබීමයි. ජාතිය හා ආගම නොතකා කිතුනු දයාව හා සැම දනන් හට ගෞරව කිරීම පිළිබඳව එතුමා දුන් ආදර්ශය අදටත් අප ප්‍රබෝධයට පත් කරමින් අපට ගුරුහරුකම් ලබා දෙයි. එහෙත් සියළු ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් සභා මාතාව දක්වන ප්‍රේමය හා සැලකිල්ල පළ කිරීමත්, මේ සමාජයේ ජන ජීවිතයට ක්‍රියාකාරි ලෙසින් සහභාගි වන්නට කතෝලික සැදැහැ සංඝය තුළ ඇති ආශාව සහතික කිරීමත් මාගේ සංචාරයෙන් අදහස් කෙරේ.



බොහෝ ජන සංඝයන් එකිනෙකා අතරේ යුද වැදී සිටීම අප වසන ලෝකයෙහි අඛණ්ඩ ඛේදාන්තයක් වී තිබේ. පැරැණි හෝ අලුත් වෙනස්කම් හා මතභේදයන් සමථයකට පත් කර ගන්නට නොහැකිවීමෙන් වාර්ගික හා ආගමික අවිනිශ්චිතතාවයන් පැන නැගී තිබේ. මේවා නොයෙක් විට හිංසාව පැතිරයන්නට හේතුභූතවී ඇත. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාව සිවිල් අරගලයන්හි භීතිය අත්දැක තිබේ. සාමය තරකර ගනිමින් ගතවූ ඒ වර්ෂයන් තුළදී ඇති වූ වණ කැලැල් සුවකර ගන්නට ශ්‍රී ලංකාව දැන් උත්සාහ දරමින් සිටී. ගැටුම් තුළින් බිහි වූ අසාධාරණකම්, සතුරුකම් හා අවිශ්වාසය පිළිබඳ තිත්ත උරුමය පිටුදැකීම ඒ සා පහසු කාර්යයක් නොවේ. එය සිදු කළ හැක්කේ නපුර යහපතින් ජයගැනීමෙන් (රෝම 12;21) හා සමඟි සන්ධානය, සහයෝගිතාවය හා සාමය වඩවන එම යහගුණාංගයන් වගා කිරීමෙන් පමණි. සුව කිරීමේ ක්‍රියාවලියට සත්‍යය සොයා යාමද ඇතුළත් විය යුත්තේ පැරැණි තුවාල පාරන්නට නොව යුක්තිය, සුවදානය හා එක්සත්කම වඩවන්නට අවැසි මගක් ලෙසිනි.

හිතාදර මිත්‍රවරුනි, මේ දේශයෙහි සිදුවෙමින් පවත්නා සමගි සන්ධානයේ හා නැවත ගොඩනැගීමේ සියුම් ක්‍රියාවලියෙහි ලා විවිධ ආගමික සම්ප්‍රදායන්හි අනුගාමිකයන්ට අත්‍යවශ්‍ය කාර්යයක් තිබෙන බව මට තහවුරු වී තිබේ. ඒ ක්‍රියාවලිය සාර්ථකවන්නට නම්, සමාජයේ සියළු සාමාජිකයන් එක්ව කටයුතු කළ යුතුය; සියල්ලන්ටම හඬක් ඇත . තම අභිලාෂයන්, අවශ්‍යතාවයන්, අපේක්ෂාවන් මෙන්ම තම බිය පළකරන්නටත් සියල්ලන් හට නිදහස තිබිය යුතුය. ඉතාම වැදගත්වන්නේ එකිනෙකා පිළිගන්නටත්, නීත්‍යනුකූල විවිධත්වයන් ගරු කරන්නටත්, එක පවුලක් ලෙසින් දිවිගෙවන්නට ඉගෙන ගන්නටත් ඔවුන් සූදානමින් සිටීමයි. ජනතාව බැහැපත්ව හා විවෘතව එකිනෙකා හට සවන් දෙන විට ඔවුන් පොදුවේ බෙදා ගන්නා වටිනාකම් හා අපේක්ෂාවන් වඩ වඩාත් වැදගත්වනු ඇත. විවිධත්වය තව දුරටත් තර්ජනයක් ලෙසින් නොව වැඩිදියුණුවීමේ මාර්ගයක් ලෙසින් පෙනී යයි. යුක්තියට, සමඟි සන්ධානයට හා සමාජ සුසංයෝග යට මඟ වඩ වඩාත් සුපැහැදිලිව දකින්නට හැකිවනු ඇත.

මෙනයින්, නැවත ගොඩනැගීමේ මහා කාර්යභාරයට ඇතුළත්විය යුත්තේ යටිතල ව්‍යුහයන් වැඩිදියුණු කිරීමත්, ද්‍රව්‍යමය අවශ්‍යතාවයන් ඉටු කරදීමත්ය. එහෙත් මානව අභිමානය, මානව අයිතීන් පිළිබඳ ගෞරවය හා ජන සමාජයේ එක් එක් සාමාජිකයන් පූර්ණ වශයෙන් ඇතුළත් කිරීම වඩවා ලීම ඊට වඩා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ දේශපාලන, ආගමික හා සංස්කෘතික නායකයින් තම සැම වදනක් හා ක්‍රියාවක්ම සලකා බැලීම තුළින්, උදාවන යහපත හා සුවදානය මගින්, ශ්‍රී ලාංකිකයන්ගේ ලෞකික හා ආධ්‍යාත්මික ප්‍රගතිය අරභයා තිර දායකත්වයක් ලබා දෙනු ඇතැයි යන්න මාගේ බලාපොරොත්තුවයි.

ගරු ජනාධිපති තුමෙනි, හිතාදර මිත්‍රවරුනි, ඔබ මට ලබා දුන් පිළිගැනීමට යළිත් වරක් ස්තූතිවන්ත වෙමි. අප එක්ව ගතකරන මේ දිනයන් මිත්‍රත්වයේ, සංවාදයේ හා සහයෝගිතාවයේ දිනයන් බවට පත්වේවා! 'ඉන්දියන් සාගරයේ මුතු ඇටය' වන ශ්‍රී ලංකාවට දෙවිඳාණන්ගේ ආශිර්වාදය බහුලව ලැබෙන ලෙස ආයාචනා කරමින් එහි අලංකාරය එහි සියළු වැසියන්ගේ සෞභාග්‍යය හා සාමය තුළින් දිදුලන ලෙසට පතමි.

# සංවාදය හා සංහිඳියාව ජනතාව අතර නංවමින් සාමය සියලු දෙනා අතර බෙදී යන්නට කටයුතු කරමින් සිටිනවා

## කටුනායක ගුවන් තොටුපලේදී ජනාධිපතිතුමා පැවැත්වූ කථාව

**අති උත්තම සුදුතුම් පියතුමෙනි,**

ශුද්ධාසන රාජ්‍ය ලේකම් තුමා ඇතුලු සාමාජික නියෝජිතවරුනි, ගෞරවනීය අගමැතිතුමනි, ගරු කැබිනට් ඇමතිවරුන් ඇතුලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, තානාපතිවරුනි, නෝනාවරුනි, මහත්වරුනි,

සුදුතුම් පියාණන් ශ්‍රී ලංකාවට පිළිගැනීමට මගේ රජය හා ජනතාව වෙනුවෙන් ලත් මේ ඓතිහාසික හා ප්‍රීතිමත් අවස්ථාවේ අති උතුම් ශුද්ධෝත්තම පියතුමා ආසියාවේ සහ ශ්‍රී ලංකාවේ අපෝස්තලික චාරිකාවක නියැලීම තවදුරටත් අපට මහත් ගෞරවයකි.

ඔබවහන්සේගේ සංචාරය මට පෞද්ගලිකව සුවිශේෂී වන්නේ ජනාධිපති ධුරයට මා තෝරා පත්කර ගත්තේ දින ගණනකට පෙරාතුව වන අතර ශුද්ධෝත්තම පිය ශ්‍රී ලංකා සංචාරය මගේ ධුරකාලය අරඹන්නට ඔබවහන්සේගේ ආශිර්වාදය ලබා ගැනීමට මට අවකාශ සලසා දී ඇත . මීට වසර විස්සකට පෙර අති උතුම් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා මේ බිමට පිළිගැනීමට හැකිවිය.

එදා ශ්‍රී ලංකාව ත්‍රස්තවාදි අර්බුදයේ ගිලී පැවති අතර ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාවන් නිසා ජනතාව එදිනෙදා බරපතල දුක් කරදර වලට මුහුණ පෑහ. ශුද්ධෝත්තම පියතුමා අද මෙරටට වැඩම කරන්නේ අලුත්ම ශ්‍රී ලංකාවකට ය. සාමය සහ සමෘද්ධිය දිවයිනේ සියලු කලාපයන්ට ගලා යෑම නිසා එහි ප්‍රතිඵල ජනතාව සතුටින් අත්විඳිමින් ගරුත්වයෙන් යුතුව ජීවත්වීමට අවකාශ සැලසී ඇත.

දරිද්‍රතාවයේ අභියෝගය ජය ගැනීමට මේ ක්‍රියාදාමයන් හේතුවී ඇති බව අවිවාදාත්මකය. දරිද්‍රතාවය දුරු කිරීම සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් දක්වන අතර ධනවතුන් හා දිළිඳුන් අතර පවත්නා ආර්ථික පරතරය අඩු කිරීමට ඒවා සම්බන්ධ වී ඇත.

ශුද්ධෝත්තම පියතුමනි, ශ්‍රී ලංකාවට පැමිණි ඔබවහන්සේගේ මේ චාරිකාව සුවිශේෂී අවස්ථාවක් වන්නේ මගේ රජය සංවාදය හා සංහිඳියාව ජනතාව අතර නංවමින් සාමය සියලු දෙනා අතර බෙදී යන්නට කටයුතු කරමින් සිටින නිසාවෙනි. අපගේ සියවස් ගණනාවක් ඉපැරැණි ආධ්‍යාත්මික උරුමයෙන් ආගමික සහජීවනය කෙරේ විශ්වාසය තබන ජනතාවක් වන්නෙමු.

ශුද්ධෝත්තම පියතුමන්ගේ සුවිශේෂී දායකත්වය සාමය සහ සංහිඳියාව ජාතින් සහ සමාජයන් අතර ගොඩනැගීමට හේතුවන අතර ශ්‍රී ලංකාවේ දේශීය ක්‍රියාකාරකම් වලට මේ සංචාරය මහත් දායකත්වයක් දක්වනු ඇත.

අති උත්තම ශුද්ධෝත්තම පියතුමනි, ඔබවහන්සේගේ මේ චාරිකාවේදී ශ්‍රී ලංකාවේ ප්‍රථම සාන්තුවරයාණන් වූ ඉන්දියාවේ ගෝවා ප්‍රදේශයෙන් පැමිණි කතෝලික ධර්මදූතවරයකු වූ භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමා සාන්තුවරයට ඔසවන අතර මෙරට කතෝලික විශ්වාසය වර්ධනය කිරීමෙහිලා උන්වහන්සේ සුවිශේෂී දායකත්වයක් දැක්වූහ. මේ සාන්තුවරයා ශ්‍රී ලංකාවේ ජනතාවගේත්, කලාපයේත්, විශේෂයෙන් කතෝලික විශ්වාසයෙත් වැදගත් අවස්ථාවකි. අති උතුම් සුදුතුම් පියාණනි, අප රටවල් දෙක ලෝකයේ ප්‍රධාන ආගම් දෙකක් වන කිතු දහම සහ බුදු දහම රැක ගැනීමෙහිලා සුවිශේෂී දායකත්වයක් දක්වා ඇත. ශුද්ධවූ සුවිශේෂයේ දැක්වෙන පරිදි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සිය අනුග ාමිකයන්ට මෙසේ වදාළ සේක. 'ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න.' (මතෙව් 5:44) බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ පරිදි 'වෛරයෙන් වෛරය නොසන්සිඳේ. එහෙත් ප්‍රේමයෙන් පමණක් සංසිඳේ. නපුර යහපත මඟින් යටපත් කැරේ.'(ධම්මපදය) මේ ස්වර්ගීය ඉගැන්වීම ක්‍රිස්තියානි සහ බුදුනු වටිනාකම් බෙදා හදා ගන්නා මගේ රටේ ජනතාව අදහන ආගම්ය. ඔවුන් අපට සිහිපත් කරන්නේ අන්තර් සාමයික සංවාදය සමාජ සමෘද්ධියට සහ සහයෝගිතාවයට හේතුවන



බව ඉකුත් සතියේ ලෝක සාම දින පණිවුඩය මඟින් ශුද්ධෝත්තම පියතුමා ද සඳහන් කළ කරුණුය. ශ්‍රී ලංකාවේ රජය සහ ජනතාව වෙනුවෙන් ඔබවහන්සේගේ මේ චාරිකාව වඩාත් ඵලදායි හා සදානුස්මරණීය එකක් වේවායි ප්‍රාර්ථනා කරමි. ශ්‍රී ලංකාව සහ ශුද්ධාසනය අතර සබඳතා වඩ වඩාත් සවි ගැන්වෙන සුලු සංවාදයන් හා ක්‍රියාමාර්ගයන් වෙත ඉදිරියේදී යොමු වන්නට බලාපොරොත්තු වෙමි.

ඔබවහන්සේගේ පීතෘක ආශිර්වාදය මෙරට මෙන් එතෙර ද වෙසෙන ශ්‍රී ලාංකීය ජනතාවට ලබා දෙන්නැයි ද අප රටේ සාමය, සංවර්ධනය හා සමෘද්ධිය උදෙසා යදින මෙන් ද ඔබවහන්සේගෙන් ඉල්ලා සිටිමි.

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 18 ඉරිදා


# අභිමානනීය වූ ධර්මදානයේ චාරිකාව




අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පිය ශ්‍රී ලංකා දේශයට පය තැබූ මොහොතේ පටන් ධර්මදානීය ගුණ සුවඳකින් මිනිස් ජීවිත පමණක් නොව ස්වභාව ධර්මයා පවා සැනහුම් සුසුමකින් ලැබෙන සනහාලීමට පත්වී ඇති සෙයක් දිස්කරයි. එය සැබෑවකි. බිලියනයකට අධික ලොව පුරා වෙසෙන කතෝලික සැදැහැවත් ජනතාවගේ ආධ්‍යාත්මික නායකයාණන් ලෙසින් ඒ දහම් මගේ ඇති සුවිශේෂී අනන්‍යතාව තුළ ධර්මදානීය චාරිකා තුළ දී එතුමන් විහිද යවන ප්‍රබල මනුෂ්‍යත්වයේ ගැඹුරු ආධ්‍යාත්මික පණිවිඩය මේ මොහොතේ අප මව්බිමේ ජනතා හදවත් වලටද දැඩිව බලපා ඇති බවක්ද පෙනේ.

අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ ඒ අත්‍යන්ත උතුම් මිනිස් කමේ පණිවිඩය සැනෙකින් අවබෝධ කරගන්නට මේ ලක් බිමේ දකුණු කොනේ සිට උතුරු කොන තෙක් සසුනිසුරාණන්ගේ ශ්‍රී ලංකා ගමනේදී එතුමන් එකී ශීලාචාර ගුණගරුක විනයානුකූල ශ්‍රී ලංකා ජනතාව ගැන අමන්දානන්දයට පත්ව සිටී. ධර්මදානීය චාරිකාවක් යනු එකිනෙක සම්ප්‍රදායන් හා විශ්වාසයන් අවබෝධකර ගන්නට ඒ ඒ ජනතාවට මිනිස් කමේ පණිවිඩයක් ප්‍රබලවම විහිද හැරීමකි. මිනිස්කමට නිගා දෙන විවිධ වූ පටු බලවේග වලින් මිදීමකට මඟ පෙන්වීමකි. තම තමන්ගේ විශ්වාසයන් ගැඹුරින්ම තේරුම් ගන්නට ඉඩ හසර විවර කිරීමකි.

එය ඉටුකරන්නට ප්‍රැන්සිස් සසුන් පිය ලංකා ගමන සමත් වී තිබේ. අප රටේ වෙසෙන බහුතරයක් බෞද්ධ සහෝදර ජනතාව තම ගැඹුරු ආධ්‍යාත්මයේ සංවේදී බව කදිමට දිස් කරමින් සසුන් පිය ගමනේ දී පෙන්වූ හොඳ හිත අද මුළු මහත් ලෝකයක්ම කථා කරයි. හින්දු ලබ්ධික අප සහෝදර ජනතාවගේ විහිදව ජීවත් වන ජනතාවට අසීරු නොවුනේ අපේ ශ්‍රී ලාංකේය ජනතාව ආගම් හතරක ආභාෂය ලබන සිල්වත්, ශිලාචාර ජනතාවක්ම නිසාවෙනි. අවිහිංසක සරල බවේ ගැඹුරු පණිවිඩය ගැන අද මුළු මහත් ලෝකයක් ප්‍රසන්නව කථා කරයි. විනයානුකූලව ඉස්ලාම් පැවැත්මේ ශ්‍රී ලාංකික අප සහෝදර මුස්ලිම් ජනතාවගේ අවදි වීම ගැන අද මුළු මහත් ලෝකයක්ම පහන් සිතින් කථා කරයි.

ආධ්‍යාත්මික ගුණ වගාවේ සැබෑ වර්ධනය එයයි. අන්තර් සාමයික එකමුතුව තුළ ශ්‍රී ලාංකේය ජනතාවගේ හැදියාව හා එකමුතුකම ගැන කථා කරන්නේ අද ලෝක ජනතාවයි. පටු භේද අමතක කළ දින හතරක පින්වත් පැවැත්ම දිගු කාලයකට රැගෙන යාම දැන් අපේ යුතුකමයි. තවදුරටත් මේ දේශය භේද බින්න විය යුතු නැත. සැකයට ඉඩ දිය යුතු නැත. පාට පක්ෂ තුළ අතරමංව මංමුලා විය යුතු නැත. ජාතිය, ආගම නිසා විරසක වීම ඇතිකර ගත යුතු නැත. ඒ සියල්ලෙහි පෞද්ගලික අයිතිය තම තමන්ගේ අනන්‍යතාව තුළ සංයමයකින් අත්දකින්නේ නම් අනෙකා වෙත අනවශ්‍ය බියක් හෝ බරක් පැටවිය යුතු වන්නේ නැත. අද එවන් ගමනක් යන්නට අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන් අපට මාවතක් විවෘත කර ඇත්තේය. එතුමන් අප අතරට ආවේ විවෘත කරවන ඒ මාවතේ සැබෑ මනුෂ්‍යයෙක් වන්නේ කෙසේද යන්න ක්‍රියාවෙන්ම පෙන්නුම් කිරීමටයි. එය අප දේශයේ ජනතාව පටු භේද පසෙකට දමා සැබවින්ම අවබෝධ කර ගත් බව ගෙවුනු දින කිහිපය තුළ සැබෑවටම පෙන්නුම් කර ඇත. ගාලු මුවදොර සිට මඩු සිද්ධස්ථානය තෙක් සුවඳවත් කළ ඒ අවබෝධ කරලීම තුළ අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ ශ්‍රී ලංකා ගමන සැබවින්ම අභිමානනීය ධර්මදානයේ චාරිකාවක් වී ඇති බව එකහෙලාම පැවසිය යුතු වන්නේය. ඒ ගමනට අන් සහෝදර ජනතාව සමග එක්ව යන්නට පිබිදුනු මනසකින් හා සංවේදි ඇතුලාන්තයකින් මේ දේශයේ වෙසෙන කතෝලික ජනතාව සූදානම් බවද පවසන්නේ නිහතමානි අභිමානයකිනි.

# ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට ආදර්ශයක් වූ හිටපු ජනපති



හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ජනවාරි 8 වැනිදා පැවැති මෙරට සත්වැනි ජනාධිපතිවරණයේදී ජනතාවගේ ඡන්දයෙන් පරාජයට පත්වීම නිසා ප්‍රතිඵල නිකුත්වී අවසන් වීමටත් පෙර අරලිය ගහ මන්දිරයෙන් පිටත්ව යෑම මෙරට තුළ බලය හුවමාරු කර ගැනීමේ සුමට ක්‍රියාවලියක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදි ලෝකය තුළ ඇගයීමට ලක්ව තිබේ.

අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාට මෙරටට වැඩම කරන්නැයි ඇරියුම් කළ රාජ්‍ය නායකයා ලෙස සසුන් පියාණන් මෙරටට පා තබන දිනයට සිවු දිනකට පෙර ජනාධිපති පුටුවෙන් බැස ජනමතයට හිසනමා යන්නට ගියේය. පුරා තිස් වසරක් මෙරට දවා අළු කළ ත්‍රස්තවාදය පරාජය කරන්නට උට්ඨාන වීර්යයෙන් කටයුතු කළ නායකයා ලෙස ඒ මහතා ජනතාවට සමීප විය.

2005 දී පැවැති මෙරට පස්වැනි ජනාධිපති වරණයෙන් ජයලබා ජනාධිපති පදවියට පත්වූ මහින්ද රාජපක්ෂ මහතා 2010 දී දෙවන වරටත් ජනාධිපති පදවියට පත්විය. එතුමා සිය ධූර කාලය නිමාවන්නට වසර දෙකක් තිබිය දී 2014 දී ජනාධිපතිවරණයක් කැඳවූ අතර මෙරට සත්වැනි ජනාධිපතිවරණය වූ ඉන් 47.8% ප්‍රතිශතයක් ඡන්ද ලබාගත් අතර ප්‍රතිවාදි අපේක්ෂකයා 51.20% ලබාගැනීම නිසා ඔහු පරාජයට පත් විය.

# නව රජයට කතෝලික සුබ පැතුම්



නව ජනාධිපති
මෛත්‍රීපාල සිරිසේන මහතා



නව අගමැති
රනිල් වික්‍රමසිංහ මහතා



සමාජ සාමය හා ක්‍රිස්තියානි කටයුතු භාර ඇමති ජෝන් අමරතුංග මහතා

ශ්‍රී ලංකාවේ පැවැති සත්වන ජනාධිපතිවරණයෙන් පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ජයගැනීම නිසා මෙරට සයවැනි ජනාධිපති ලෙස පත්වන්නට වරම් ලබා ඇත. මේ අතර රජයේ නව අගමැති ලෙස රනිල් වික්‍රමසිංහ මහතා පත්කර ඇති අතර 27 දෙනෙකුගෙන් යුතු නව කැබිනට් මංඩලයක් ද පත්ව සිටී. එහි මහජන සාමය සහ ක්‍රිස්තියානි කටයුතු ඇමැති ධූරය ජෝන් අමරතුංග මහතාට හිමි වී තිබේ.

කැබිනට් ඇමැතිවරුන් 27 දෙනකුගෙන් ද, රාජ්‍ය ඇමතිවරුන් 11 ක් හා නියෝජ්‍ය ඇමැතිවරුන් 9 දෙනකුගෙන් සමන්විත නව රජයේ ප්‍රථම කාර්යභාරය වී ඇත්තේ ඔවුන් ජනතාවට පොරොන්දු වූ පරිදි දින සියයේ වැඩසටහන දියත් කිරීමයි. දින 100 කට පසු මහ මැතිවරණයක් පැවැත්වීමට යෝජනා වී ඇත. ස්ථිර ඇමැති මණ්ඩලය ඉන්පසු පත් කැරෙන බව ප්‍රකාශයට පත් කැර තිබේ.

# පතුරා දෙව් බල ... තේජා .. ගුණ පා..

පීතෘක ප්‍රේමයේ උණුසුම
දෙන්නට
පා තැබුවා ඔබ ලොව මුතු
ඇටයට
පසසමු... පසසමු...
පියාණනි ඔබ
ජය... ජය... ජය... ජය වේ...
“පේදුරු” නම දුන්
“පර්වතයකි” ඔබ
සමිඳ අණින් ගොඩ නගම්
සභා මව
ඉර සඳු තරුමල් තිබෙන තුරාවට
ලෝ සත පවිටෙන් මුදන
විලාසෙට
බලගන්වමි ඔබ ජන සෙත
සදහට

**ඇතගම
වින්සන් ලියනගේ**

# කැමිලස්ගේ — තිත්ත ඇත්ත




Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

සුදුතුම් පිය ලංකාගමන 2015



04

ප්‍රේමයේ පවතින්න...

# ආගමික සහජීවනය, ජාතීන් අතර සමඟිය තුළින් ලෝක සාමය උදෙසා වටිනා දයකත්වයක් දැක්විය හැකි රටකි

## සියම් නිකායේ කෝට්ටේ පාර්ශවයේ මහානායක අති පූජ්‍ය ඉත්තෑපානේ ධම්මාලංකාර හිමිපාණන්ගේ අනුශාසනාව



ශුද්ධෝත්තම පියතුමනි, ඔබතුමන් පිළිගනිමින් මේ අනුශාසනාව සිදුකරන්නට ලැබීම ගැන මම මහත්සේ සතුටට පත්වන්නෙමි. ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයක් සහ ප්‍රෞඪ සංස්කෘතියක් ඇති රටකි. ආගමික සහජීවනය, ජාතීන් අතර සමඟිය තුළින් ලෝක සාමය උදෙසා වටිනා දයකත්වයක් දැක්විය හැකි රටකි. එහිලා එරටට සුවිශේෂී බහු ආගමික සහ බහු වාර්ගික උරුමයන් පවතී.

මෙහිදී සම්බුදු රජාණන් වහන්සේගේ දේශනාවක් සිහිපත් කිරීමට මම කැමැත්තෙමි. 'ඔබ ඔබගේ කාර්යයන් කළ යුතුය. තථාගතයන් වහන්සේ හුදෙක් මාර්ගය කියා දෙන්නාහු වෙති. මවක තම දරුවා කෙරෙහි දක්වන මාතෘ සෙනේහය බෞද්ධ හෝ කතෝලික බවක් නොගනී. එය හුදෙක්ම මව් සෙනෙහසයි. මේ ආකාරයටම ප්‍රේමය, ස්වත්‍යාජය, කරුණාව, සාමය සහ මිත්‍රත්වය ආදි වටිනාකම්ද, ක්‍රෝධය, වෛරය, ඊර්ෂ්‍යාව සහ අහංකාරය වැනි දුර්ගුණයන්ද විශේෂ ආගමකට පමණක් වෙන්වී නැත. ඒවා වටිනාකම් සහ දුර්ගුණයන් වන අතර මිනිසියාවට පොදු දේවල්ය. සුදුතුම් පියාණෙනි, ශ්‍රී ලංකාවේ වෙසෙන බෞද්ධ ජනතාව වෙනුවෙන් ඔබවහන්සේට ඉතා කෙටිවූවත්, වඩාත් ප්‍රීතිමත් සහ ඵලබර ශ්‍රී ලංකා චාරිකාවක නියැලෙන්නට වරම් ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

# ලෝ වැසියන් මවිතයට පත්කොට ලක්ෂ සංඛ්‍යාත විවිධ ආගමික හා වාර්ගික ජන පිරිස්වල හදවත් වසඟ කොට ඇති බව සියළු අවංක දනන් හට සුපැහැදිලිව දැකගන්නට හැකිය

## අති උතුම් ක්ලීටස් සී. පෙරේරා සා.බෙ.නි. රදගුරු හිමිපාණන් පැවැත්වූ පිළිගැනීමේ කථාව

අපගේ ශුද්ධොත්තම පිය ප්‍රැන්සිස් පාප්වහන්සේගේ ශ්‍රී ලංකා වන්දනාගමන නිමිතිකොට පවත්වනු ලබන මෙම සමයාන්තර හා සභාන්තර හමුවේදී අපගේ ඇරියුම පිළිගෙන මෙහි සපැමිණි සියල්ලන් ඉතා උණුසුම් හා හෘදයාංගම ලෙසින් පිළිගනු සඳහා මේ ගමනේ සංවිධායක කමිටුවේ සභාපති ලෙසින් මා ඔබ හමුවේ සිටින්නේ සැබෑ නිහතමානිකමින් හා ඔබ එකිනෙකා හට ඇති ගෞරව පෙරදැරිවයි.

මෙහි පැමිණි සියල්ලන් වෙනුවෙන් ඔබවහන්සේට ගෞරව පිණිස මේ සම්භාවනීය හමුවට රෝමානු කතෝලික සභාවේ විශ්ව එඬේරාණන් වන ඔබවහන්සේව පිළිගන්නට හැකිවීම අති මහත් ගෞරවයක් හා වරමක් කොට සලකමි. අති උතුම් ශුද්ධෝත්තම පියතුමෙනි, ශ්‍රී ලංකා ද්වීපය බහු ආගමික සමාජයක වෙසෙන රටක් බව සැබෑය. අති විශාල බහුතරය බුදුනු අනුගාමිකයෝය. ඔබවහන්සේට ආචාර කරන්නටත්, ඔබවහන්සේගේ සුබාශිංසන හා ආශිර්වාදය ලැබගන්නටත් මේ සන්ධ්‍යාවේ ඔබවහන්සේව මේ සමයාන්තර හා සභාන්තර හමුවට පිළිගැනීමට හැකිවීම අප හට සුවිශේෂ ගෞරවයකි; ප්‍රීතියකි. මෙය ශ්‍රී ලංකා ඉතිහාසයේ, වෙසෙසින්ම කතෝලික සභා ඉතිහාසයේ සනිටුහන් කෙරෙන පූජනීය හා අසමසම සිදුවීමක් බවට සැකයක් නොමැත.

අතිඋතුම් ශුද්ධෝත්තම පියතුමෙනි, ඔබවහන්සේ පාප් ධූරයට ඔසවනු ලැබ ගෙවී ගිය කෙටි කාලය තුළදී ඔබවහන්සේ ලෝ වැසියන් මවිතයට පත්කොට ලක්ෂ සංඛ්‍යාත විවිධ ආගමික හා වාර්ගික ජන පිරිස්වල හදවත් වසඟ කොට ඇති බව සියළු අවංක දනන් හට සුපැහැදිලිව දැකගන්නට හැකිය. '...... දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙනම තබා ගත යුතු වස්තුවකැයි නොසිතා, එය ඉවතලා සේවකයකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මිනිස් කෙනකු වූ ......' (ශු. පාවුළු තුමා පිලිප්පිවරුන් වෙත යැවූ හසුනේ 2,6 සහ 7) අප ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මෙන්ම බොහෝ ශුද්ධවරයන්ගේ ද, වෙසෙසින්ම ඔබවහන්සේගේම නාම සාන්තුවර අසීසියේ ශු. ප්‍රැන්සිස් මුනිතුමන්ගේ ද ආදර්ශය අනුව යමින් උඩඟු කමින් හා උත්සවශ්‍රියෙන් තොර, චාම් හා බැහැපත් ජීවිත පැවැත්මක් තුළින් ඔබවහන්සේ අපට අභියෝගයක් වී ඇති බැව් නොබියව පවසමි. මේ ඓතිහාසික අවස්ථාවේදී ඔබවහන්සේ අප හමුවට වැඩම කිරීම සුවිශේෂ වරප්‍රසාදයක් හා සිත් පිනවන අත්දැකීමක්ම වන්නේය.



දෙවනුව මේ මොහොතේ මෙහි සැපත්ව සිටින අතිඋතුම් කාදිනල් හිමිපාණන් වහන්සේලා ද, ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති හිමියන්ද, කතෝලික හා එංගලන්ත සභාවල අතිඋතුම් අගරදගුරු හිමිවරුන් හා රදගුරු හිමිවරුන් ද, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ගෞරවනීය නායකකාරකාදින්ද, සියළු ගිහි, පැවිදි, පූජක පිරිස් ද ඉතා ගෞරවනීය අයුරින් හා උණුසුම් ලෙසින් පිළිගන්නට කැමැත්තෙමි. ඉන්පසුව, මේ මොහොතේ මෙහි පැමිණි විවිධ නිකායවලට අයත් අති පූජ්‍ය මහානායක ස්වාමින්වහන්සේලාද, අති ගරු අනුනායක සංඝයා වහන්සේලාද, අතිගරු සංඝනායක හිමිවරුන්ද, අතිගරු ලේඛකාධිකාරි හිමිවරුන්ද, මහා සංඝයාවහන්සේලාද, අතිගරු නල්ලූර් අධිනම්, ගරු කුරුක්කල් ඇතුළු සමස්ත හින්දු සංගමයේ ගෞරවනීය නායකකාරකාදින්ද, හින්දු ආගමේ අනෙකුත් නියෝජිතයින්ද, සමස්ත ලංකා ජම්මියතුල් උලාමා ගෞරවනීය නායකකාරකාදින්ද, අනෙකුත් ඉස්ලාම් ආගමික නියෝජිතයින්ද, අපගේ අනෙකුත් සියළු හිතමිත්‍රයින් හා සුබ පතන්නන්ද ඉතා ගරුකටයුතු හා උණුසුම් ලෙසින් පිළිගන්නට කැමැත්තෙමි.

අපගේ ආරාධනය පිළිගෙන මෙහි වැඩම කළ ඔබවහන්සේ සැබැවින්ම අප හට ගෞරවයකි; දිරියකි. අපගේ ශුද්ධෝත්තම පිය ප්‍රැන්සිස් පාප්වහන්සේගේ සිරිලක් වන්දනා ගමන අරභයා පවත්වනු ලබන මෙම ඓතිහාසික හා සුවිශේෂිත හමුව එකහෙලා පිළිගෙන එයට සහභාගි වූ ඔබ සැම හට හද පත්ලෙන්ම තුති පුදමු. දෙවිඳාණෝ ඔබ සැම ආසිරි ගන්වන සේක්වා!





Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55




# මගේ චාරිකාව අන්තර් සාමයික සහ කිතුනු ආගම් අතර සබඳතාව තර කරන්නට හේතු වේවා!

## අන්තර් ආගමික සමුළුව අමතා ශුද්ධෝත්තම පියතුමා පැවැත්වූ කථාව

**දයාබර මිත්‍රවරුනි,**

ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට බද්ධවූ විශාලතම ආගම් හතරවන බුදු දහම, හින්දු, ඉස්ලාම් සහ කිතුනු දහම් නියෝජිතයන් එකමුතුව පවත්වන මේ රැස්වීමට එක්වන්නට ලැබීම පිළිබඳව මම මහත් සතුටු වෙමි. ඔබගේ සහභාගිත්වය සහ උණුසුම් පිළිග ැනීමට තුති පුදමි. එමෙන්ම යැදුම් හා ආශිර්වාදයන් පුද කළ සැමටත්, අති උතුම්





ක්ලීටස් චන්ද්‍රසිරි රදගුරු හිමිපාණන්ට සහ අති පූජ්‍ය ඉත්තෑපානේ ධම්මාලංකාර මහනායක හිමිපාණන්ට එතුමන්ගේ දෙසුම් වෙනුවෙන් තුති පුදමි.

මා ශ්‍රී ලංකාවට පැමිණියේ මගේ පූර්වකාලීනයන් වූ අති උතුම් සවැනි පාවුළු සහ අති උතුම් දෙවන ජුවාම් පාවුළු හිමිපාණන්ගේ මඟ සලකුණු ඔස්සේ යමින් ශ්‍රී ලංකාවේ කතෝලික සභාව කෙරේ ඇති සුවිශේෂී ප්‍රේමය හා සැලකිල්ල ප්‍රදර්ශනය කරමිනි. මෙහි කතෝලික සංඝය බැහැදැකීමට පැමිණීමත්, ඔවුන්ගේ ක්‍රිස්තියානි විශ්වාසය තහවුරු කිරීමටත්, ඔවුන් සමඟ යාච්ඤා කිරීමට සහ ඔවුන්ගේ ප්‍රීතිය හා වේදනා බෙදා හදා ගැනීමටත් ලද මේ අවස්ථාව වරප්‍රසාදයක් ලෙස හඟිමි. එලෙසින්ම මේ සුවිශේෂී ආගමික සම්ප්‍රදායයන්ගෙන් පොහොණී වූ කාන්තාවන් හා පුරුෂයන් ද, ඔබ සියල්ලන් ද මේ වරප්‍රසාදයට සමසේ වරම් ලබන අතර ප්‍රඥාව, සත්‍යය හා ශුද්ධවන්තභාවය ඔවුහු අප සමඟ බෙදා හදා ගනිති.

දෙවන වතිකාන කතිකාවේදී කතෝලික සභාව ඇගේ ගැඹුරු හා පවත්නා ගරුත්වය සෙසු ආගම් වෙත පළකර ඇත. සභා මාතාව 'මේ ආගම්වල කුමක් නිවැරැදි හා ශුද්ධවන්ත දැයි කිසිවක් ප්‍රකාශ නොකරන අතර සභා මාතාව තුළ ඔවුන්ගේ ජීවිත හා චර්යාවන් ගැනත් ඔවුන්ගේ ලේඛනයන් හා සංඥානයන් ගැනත් උසස් ගෞරවයක් පවතී. (නොස්ට්‍රා ඇතාතේ 2) මාගේ කාර්යය ලෙස ඔබ කෙරේ ඔබේ සම්ප්‍රදායයන් සහ විශ්වාසයන් ගැන සභාවේ ගරුත්වය තහවුරු කිරීමට මම කැමැත්තෙමි.

මේ ගරුත්වයේ ස්ප්‍රීතුව තුළ කතෝලික සභාව ඔබ සමඟද, යහපත් සිතැති සියල්ලන් සමඟ ද එකමුතුව ශ්‍රී ලංකාවේ සුබසාධනය උදෙසා ක්‍රියා කරන්නට තීරණය කර ඇත.

මගේ චාරිකාව අන්තර් සාමයික සහ කිතුනු ආගම් අතර සබඳතාව තර කරන්නට ඉකුත් කාල වකවානුවල ගත් විවිධ ක්‍රියා මාර්ග වඩ වඩාත් තීව්‍ර කරන්නට හේතු වනු ඇතැයි විශ්වාස කරමි.

මේ අගය කටයුතු ක්‍රියා මාර්ගයන් සංවාදය සඳහා අවස්ථා උදා කර ඇති අතර එකිනෙකාට ගරු කිරීමට හා තේරුම් ගැනීමට එය ඉතාමත් අත්‍යවශ්‍ය වේ. එහෙත් අත්දැකීම් මඟින් පෙන්නා දෙන පරිදි මේ සංවාදයන් සහ යොමුවීම් වඩාත් ඵලදායී වීම සඳහා ගෞරවනීය කැපවීම් එහිලා සිදුවිය යුතුය. තවදුරටත් එවැනි සංවාද අපගේ විශ්වාසයන්, සම්ප්‍රදායයන් හා පිළිවෙත් කෙසේ විය යුතු දැයි ප්‍රකාශ කරයි.

එහෙත් අපගේ විශ්වාසයන් පළ කිරීමේදී අප අවංක විය යුතු වන්නේ පොදුවේ අප දරා සිටින දේ වඩාත් පැහැදිලිව දැක ගැනීමට එමඟින් අපට අවකාශ සැලසෙන හෙයිනි. අන්‍යෝන්‍ය අගය කටයුතු බව, අන්‍යෝන්‍ය සබඳතාව සතු වඩාත් මිත්‍රශීලීභාවය උදෙසා නව මාවත් ඒ ඔස්සේ විවරවනු ඇත .

මෙවැනි ධනාත්මක වර්ධනයන් අන්තර් සාමයික සබඳතා හා කිතුනු ආගමික සබඳතා ශ්‍රී ලංකාව තුළ වර්ධනය වීමේ අවකාශ පවතී. වසර ගණනාවක් තිස්සේ මේ රටේ කාන්තාවන් හා පුරුෂයන් සිවිල් අරගල හා ප්‍රචණ්ඩත්වයේ ගොදුරු බවට පත් වූහ.

දැන් අවශ්‍යව ඇත්තේ තුවාල සුවපත් කිරීම සහ එකමුතුවයි. තවදුරටත් අර්බුදයන් හෝ බෙදීම් අවශ්‍ය නැත. සහතික ලෙස සුවපත් කිරීමේ සහ එකමුතුවේ රැකවරණය සුවිශේෂී දෙයක් වන අතර එය දේශයේ යහපත උදෙසා හදවත් ඇත්තවුන්ගේ මෙන්ම සමස්ත මානව පවුලේම අවශ්‍යතාවයකි. එහෙයින් මගේ බලාපොරොත්තුව නම් අන්තර් සාමයික සබඳතාවය සහ කිතුනු සමඟිය මඟින් වනිතාවන් හා පුරුෂයන් ස්වකීය අනන්‍යතාවයන් වූ ජාතිකත්වය හෝ ආගමිකත්වය අහිමි කර ගන්නවා වෙනුවට සිය සහෝදර සහෝදරියන් සමඟ සමෘද්ධියෙන් ජීවත් වීමට ඉඩකඩ ලබා දිය යුතුයි.

විවිධ ආගමික අනුගාමිකයන්ට මේ සේවාව කරගෙන යෑමට කොපමණ නම් මාර්ග තිබේද? සහෘදක සහයෝගිතාවය නමැති සුවදෙන ආලේපනය ආලේප කළ යුතු අවශ්‍යතා සහිත පිරිස කොපමණ වෙත් ද? මට හැඟෙන පරිදි දිළිඳුන්, අනාථයන්, සැනසිල්ලක් සහ බලාපොරොත්තුවේ වදනක් අසන්නට පුල පුලා බලා සිටින්නන්ගේ ද්‍රව්‍යමය සහ ආධ්‍යාත්මික අවශ්‍යතා කොපමණ වේද? එහිදී මා සිතන්නේ පවුල් බොහෝ දෙනකු සිය ප්‍රියයන් වෙන්වීමේ දුකින් පෙළෙන බවයි.

ඉහත සියල්ල සමඟ ඔබගේ දේශයේ ඉතිහාසය මේ මොහොතේ දී හොඳහිත ඇති මිනිසුන් විසින් සමස්ත සමාජයක් ලෙස ශීලධාර්මික පදනමක් ඇතිව යළි ගොඩනගන්නට වෙහෙසෙමින් සිටිනවාද? විවිධ ආගමික සංඝයන්හි නායකයන් අතර ගොඩනැගෙමින් පවත්නා සහයෝගයේ ස්ප්‍රීතුව තුළ සියලු ශ්‍රී ලාංකිකයන් සංහිඳියාව ඔස්සේ සමාජයත්, එහි සියලු ආයතනත් නවමං ගන්වන්නට පෙළ ගැසෙමින් තිබේ. සාමය, ආගමික විශ්වාසයන්ගේ නාමයෙන් කිසිවිටෙක ප්‍රචණ්ඩත්වය සහ යුද්ධයට හේතුකාරක වන දේ අනුමත කළ නොහැකිය. අපගේ සංඝයන් මුළුමනින් සාමකාමී, අන්‍යෝන්‍ය සුහදතාවයෙන් සෑම ආගමක් තුළ ජීවත් වීමට කැපවිය යුතු අතර සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් හෙළා දකින්නට ඔවුහු ඇප කැප විය යුත්තාහ.

දයාබර මිත්‍රවරුනි, මම නැවත වාරයක් ඔබගේ මිත්‍රශීලී පිළිගැනීමට සහ ඔබගේ අවධානය වෙනුවෙන් තුති පුදමි. මේ සහෝදරාත්මක හමුව අප සියලු දෙනාට සමෘද්ධියෙන් ජීවත් වෙමින් සාමයේ ආශිර්වාදය බෙදා හරින්නට අවස්ථාවක් වේවා!



Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55




# 2015 සසුන් පිය ලංකා ගමනේ



අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පිය දෙදින අපෝස්තලික චාරිකාව මේ වනවිට නිමාවට පත්ව ඇත. 2015 ජනවාරි 13 වැනිදා පෙ.ව. 9.00 ට කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපලට පැමිණි අලිතාලියා ගුවන් සේවයට අයත් AZ 4000 ගුවන් යානයේ උන්වහන්සේ පැමිණියහ. අලිතාලියා ගුවන් සේවයට අයත් A330 ගුවන් යානය හිස රඳවනයන් මත සසුන් පිය නිල ලාංඡනය සටහන් කැර තිබිණ. 2015 ජනවාරි 12 සඳුදා රෝම වේලාවෙන් පස්වරු 6.50 ට පිටත්වූ ගුවන් යානය කටුනායකට පැමිණියේ පැය 11 ක ගුවන් කාලයක් ධාවනය වීමෙන් පසුවය.

ගුවන් යානය ගුවන් ගතවී පැය භාගයකට පමණ පසු වතිකාන ප්‍රකාශක ගරු ෆෙඩ්රිකෝ ලොම්බාර්ඩි පියතුමා මාධ්‍යවේදීන් වෙත පැමිණියේය. ගුවන් යානයේ පසුපස කොටසේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන් හා ඡායාරූප ශිල්පීන් එක්රොක්ව සිටි අතර ගුවන් යානයේ මැද කොටස හිස්ව පැවතිණ. ඉදිරිපස කොටසේ ශුද්ධෝත්තම පියතුමා ඇතුලු වතිකාන කාදිනල් හිමිපාණන් හා නිල මඬුල්ල අසුන් ගෙන සිටියහ. වතිකාන නිර්දේශ අනුව තෝරාගත් මාධ්‍යවේදීන්ට පැය 4 කට පෙර ගුවන් තොටුපළට යෑමට උපදෙස් ලැබී තිබූ අතර ගුවන් තොටුපළේ සියුම් ආරක්ෂක පරීක්ෂණ හා අදාල ලිපි ලේඛන, බඩු බාහිරාදිය



දැඩි පරීක්ෂාවට ලක් විනැයි වතිකාන මාධ්‍යවේදියකු පැවසීය. ගුවන් තොටුපලේ අදාල ගුවන් සමාගමේ නිළධාරින් සියලු මාධ්‍යවේදීන්ගේ ගමන් බලපත්‍ර ආගමන හා විගමන පත්‍රිකා එකතු කරගත් අතර ඒවා ආපසු ලැබුණේ චාරිකාව නිමාවේදීය.

මාධ්‍යවේදීන් සඳහා ප්‍රවෘත්ති ආවරණ බලපත්‍ර ලබාදීමත් දැඩි ආරක්ෂණ කාලවේලා (එම්බාගෝ) උපදෙස් මත සසුන් පිය කතාවන්හි සීල් තැබූ පිටපත් බෙදා දීමත් එහිදී සිදුකැර තිබිණ. ගුවන් යානය තුළ මාධ්‍යවේදීන්ට වෙන්කළ අසුන් නොතිබුණු අතර ඒ නිසාම වඩාත් පහසුවෙන් සිය වෘත්තීය ආම්පන්න (රූපවාහිනි කැමරා, පටිගත කිරීමේ යන්ත්‍ර, ආලෝක උපකරණ හා කැමරා වැනි) සමග වඩාත් සුව පහසුව ගමන් කරන්නට මාධ්‍යවේදීන් 71 දෙනකුට අවසර ලැබී තිබුණි. මේ 71 දෙනා අතර පිලිපීන ජාතික මාධ්‍යවේදීන් 14 දෙනෙක් වූහ.

සියලු මාධ්‍යවේදීන්ට සන්සුන්ව අසුන් ගන්නා ලෙස උපදෙස් දුන් ගරු ලොම්බාර්ඩි පියතුමා ගුවන් යානයේ ඉදිරිපස කොටසට ගොස් මිනිත්තු පහකට පසුව අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා සමග පැමිණියේය.

ඉතාලි බසින් කතාකළ ගරු ලොම්බාර්ඩි පියතුමා මෙවර ආසියාකරයේ අපොස්තලික චාරිකාවන් සඳහා යන මේ ගුවන් ගමන වෙනස් ආකාරයක් ගෙන ඇති බවත්, ශ්‍රී ලංකා චාරිකාවෙන් පසු පිලිපීනය බලා යන අතර මෙහි පිලිපීන ජාතික මාධ්‍යවේදීන් 14 දෙනෙක් සිටින බවත්, රට පිළිබඳව සෙසු මාධ්‍යවේදීන් දැනුම්වත් කරමින් ඔවුන්ට සහයවන්නට පිලිපීනයේදී කටයුතු කරන්නැයි ඉල්ලා සිටියේය.

අතිඋත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා උතුරා ගලා හැලෙන සිනාවකින් සංග්‍රහ කරමින් ගරු ලොම්බාඩි පියතුමා පිරිනැමූ මයික්‍රපෝනය අතට ගත් අතර 'මාගේ මේ අපෝස්තලික චාරිකා දෙකට හවුල් වී සිටින ඔබ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමි. ඔබ සැමට සුබ ගමනක් වේවා' යැයි ඉතාලි බසින් පැවසීය. ඉදිරි දින හතේදී ශ්‍රී ලංකාවේ මෙන්ම පිලිපීනයේ ද මහත් වැඩ කොටසක් සිදුකරන්නට ඇතැයි සිහිපත් කළ සසුන් පියා ඒ සඳහා එක්වන්නැයි ඉල්ලා සිටියේය. ඉන්පසු එකිනෙක මාධ්‍යවේදියා හමුවට ගොස් ඔවුන් විමසමින් හිසට අත තබා ආසිරි ගන්වමින් පීතෘක ආශිර්වාදය පිරිනැමීය.

මේ ගැන සිහිපත් කරන පිලිපීන ජාතික මාධ්‍යවේදීයකු මෙසේ කියයි. මාගේ සභාවේ නායකයා මගේ හිස මත අත තබද්දී මට මුළු ලෝකයම අත්පත් වුණා වැනි හැඟීමක් දැනිණි. උන්වහන්සේගේ උණුසුම් අත්ල මගේ හිස මත තබද්දි මුළු සියොලඟම උන්වහන්සේගේ ආශිර්වාදයෙන් පිරී ගියා වගේම මට දැනුනා.

ශුද්ධෝත්තම පියතුමා රෝමයේ සිට ශ්‍රී ලංකාවට පැමිණි ගුවන් මගේදී රටවල් අටක දේශ සීමා පසුකර එන්නට සිදුවූ අතර ඒ ඒ රටවලදී රාජ්‍ය නායකයාට විදුලි පණිවුඩයක් යවමින් සුබපතන්නට අමතක කළේ නැත.

'මම ඉරානයට ඉහළින් ගමන් කරමින් සිටින අතර අතිගරු ජනාධිපතිතුමනි, ඔබට උණුසුම් සුබපැතුම් පිළිගන්වමි' යැයි දැක්වෙන විදුලි පණිවුඩයක් ඉරානයේ ආධ්‍යාත්මික නායක අයතුල්ලා අලි හොස්නි කමේනි වෙත යැවීය. මාගේ යැදුම් වලදී ඔබවත්, ඔබේ ජනතාවත් නිරන්තරයෙන් සිහිපත් කරන බව එහිදී වැඩිදුරටත් දැක්වූ සසුන් පියා සර්වබලධාරි දෙවියන් වහන්සේගේ ආශිර්වාදය නොමඳව ලැබී සාමය හා සමෘද්ධිය උදාවේවායි ප්‍රාර්ථනා කළේය.

ඇල්බේනියාවේ ජනාධිපති බුජාර් නිශානි සහ තුර්කියේ ජනාධිපති රිසෙප් ටායිප් එර්ඩොගැන් වෙත සුබ පැතුම් යවමින් දෙරටේම සංචාරය කළ අවස්ථාවල උණුසුම් මතක සටහන් නොමැකී පවතින බව සසුන් පියා සිහිපත් කළේය. සිය යැදුම් වලදී ඔබ වෙනුවෙන් මෙන්ම දේශයේ සමස්ත ජනතාව වෙනුවෙන් යාච්ඤා කරන බවද උන්වහන්සේ ප්‍රකාශ කළහ.

උන්වහන්සේ ඊට අමතරව ඉතාලිය, ග්‍රීසිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය ඕමානය සහ ඉන්දියාව ආදි රටවලින් පියාසර කරන අවස්ථාවල ඒ ඒ රටවල නායකයන්ට හා ජනතාවට සුබපතන්නට අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියා පියවර ගත්තේය. මේ අතර පිලිපීනයට ගොස් ආපසු රෝමය බලා යන ගමනේදී සසුන් පියා රැගත් ගුවන් යානය චීනයේ ගුවන් කලාපයට ඇතුලු වීමට නියමිත අතර ඉකුත් දකුණු කොරියා සංචාරයේදී මෙන් මෙවරත් සසුන් පියා චීනයට හා එහි ආදරණීය ජනතාවට සුබපතන්නට පෙරුම් පුරමින් සිටින බව විදෙස් වාර්තා පවසයි.



2015 ජනවාරි 13 වැනිදා පෙරවරු 9 ට ගුවන් යානයෙන් පිටතට පැමිණි අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා චාරිත්‍රානුකූල පිළිගැනීම් රැසක් මධ්‍යයේ ගුවන් තොටුපළෙන් කැඳවාගෙන පැමිණියේය. ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළු සභාපති අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමි ඇතුළු රදගුරු හිමිපාණන් විසින් පිළිගනු ලැබීමෙන් පසු උන්වහන්සේ විවෘත රියක නැගී අගනුවර බලා පැමිණියහ.

මේ පිළිබඳව පසුව මාධ්‍යයට කරුණු දැක්වූ වතිකාන ප්‍රවෘත්ති අංශයේ ප්‍රධානියා වූ ගරු ෆෙඩ්රිකෝ ලොම්බාඩි පියතුමා යුරෝපාකරයේ කිසිතැනක දක්නට නැති ආසියාවේ සංස්කෘතික උරුමයන්ගේ මනා සංකලනයන්ගෙන් යුතු විශේෂාංග රැසක් මෙහිදී අත්දුටු බව පැවසීය. විචිත්‍ර වර්ණයන්ගෙන් හැඩගන්වා එක පෙළට මඟ දිගට රඳවා සිටි අලි ඇතුන් සසුන් පියා විශ්මයට පත්කළ අවස්ථාවක් බවත් ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට අගනුවර දක්වා එතුමන්ට සුබ පතන්නට ජනී ජනයා එක්රොක්ව සිටි අන්දම සසුන් පියා ඇතුලු ශුද්ධාසන නියෝජිත පිරිස විමතියට පත්කළ කරුණක් බවත් ලොම්බාර්ඩි පියතුමා විශේෂයෙන් සඳහන් කළේය.

සැලසුම් කළ කාලවේලාවට වඩා පැය 1 1/2 කටත් වැඩියෙන් සසුන් පිය රැගත් විවෘත රථයට කොළඹ බලා එන්නට ගත වූයේ මඟ දෙපස සිටි මහ ජනසන්නිපාතය ද නිසාවෙනි. අධික හිරු රැස් පතිත වීමත්, දාහය හා වෙහෙස මහන්සියත් මැද ශුද්ධෝත්තම පියතුමා කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සමග විවෘත රියේ ගමන නිමා කළහ. මඟ දිගට අවස්ථා කිහිපයකදීම ආබාධිත දරුවන්, කුඩා දරුවන් ඇතුලු ජනතාවට ආචාර කරමින්, සිප ගනිමින්, හිසට අත තබා ආසිරි ගන්වමින් ස්වකීය පීතෘක ආශිර්වාදය පිරිනමන්නට ශුද්ධෝත්තම පියතුමා යුහුසුළු විය.

පුරා පැය 11 කට අධික දීර්ඝ ගුවන් ගමනින් පසු ලක්බිමට සැපත්වූ අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමා අපෝස්තලික තානාපති කාර්යාලයට යනවිට අධික වෙහෙසට පත්ව සිටි බව

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

ඥානාර්ථ ප්‍රදීපය
ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 18 ඉරිදා




# නොමැකෙන රස විසිතුරු

ගරු ලොම්බාඩි පියතුමා පැවසීය. දිව්‍ය පූජාව පැවැත්වීමේ සිය දෛනික ණය යුක්තිය ඉටු කිරීමෙන් පසු අධික වෙහෙසකර භාවය නිසා කොළඹ අගරදගුරු මැඳුරට පැමිණීමේ වැඩසටහන මඳක් වෙනස්කරන්නට සිදුවී යැයි ලොම්බාර්ඩි පියතුමා එදින සන්ධ්‍යාවේ මාධ්‍ය හමුවේදී පැවසීය.

කෙටි විවේකයකින් පසු ජනාධිපති ලේකම් කාර්යාලයේදී ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා බැහැදැකීමට පළමු දින සන්ධ්‍යා කාලයේදී සසුන් පියා ගියේය. එහිදී ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා සසුන් පියා සමග පෞද්ගලික සාකච්ඡාවක් සිදුකළ අතර තෑගි බෝග හුවමාරු කර ගැනීමක්ද සිදුවිය. එහිදී ජනාධිපති තුමා මැණික් එබ්බවූ වීදුරු බඳුනක් සසුන් පියාණන් වෙත පිළිගැන්වූ අතර, ශුද්ධෝත්තම පියතුමා 16 වැනි සියවසේ ශ්‍රී ලංකාව ඉතා පැහැදිලිව දැක්වෙන සිතියමක් ප්‍රදානය කළේය.

එදින සන්ධ්‍යාවේ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති සර්වාගමික ආගමික හමුව අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ගේ වෙසෙස් අවධානයට ලක් වූ හමුවකි. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව හයසියයකට අධික බුද්ධ පුත්‍රයාණන් වහන්සේගෙන් පිරී ඉතිරී ගොස් තිබිණ. බෞද්ධ භික්ෂූන් වහන්සේට අමතරව හින්දු කුරුක්කල් තුමන්ද ඉස්ලාම් පූජක තුමන්ද, කිතුනු රදගුරු හිමිපාණන්ද මේ අවස්ථාවට එක්ව සිටි අතර දහසකට අධික පිරිසකගේ සහභාගිත්වය ගැන සසුන් පියා මහත් ආනන්දයෙන් සිහිපත් කරන බැව් ගරු ලොම්බාඩි පියතුමා පැවසීය එදා සසුන් පියාණන්ට මෙරටට වැඩම කරන්නැයි අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ආරාධනා කළ මොහොතේදී ශ්‍රී ලංකාවේ සිවු මහා ආගම්වල අති පූජනීය භාවයත්, එකී ආගමික කොටස් සාමයික සමඟියෙන් එක්ව දිවි ගෙවන ආකාරයත් අත්දකින්නට මෙරටට වැඩම කරන්නැයිද පැවසූ දේවල් ප්‍රයෝගිකව පෙන්නුම් කළ අවස්ථාවක් ලෙස මේ සර්වාගමික හමුව දැක්විය හැකිය. ආසියාකරයේ විවිධ ආගමික කොටස්වල සබැඳියාව පිළිබඳ අත්දැකීම් රැසක් ගොනුකර ගන්නට සමත්වූ ශුද්ධෝත්තම පියතුමා සර්වාගමික ආගමික සමගිය සඳහා ශ්‍රී ලංකාව අපූරු නිදසුනක් ලෙස හෙට දිනයේ යොදා ගතහොත් එය පුදුම වීමට හේතුවක් නොවේ.

පියතුමා වතිකාන ශුද්ධාසන නියෝජිතයන්, මෙරට අගරදගුරු හිමිපාණන් ප්‍රමුඛ රදගුරු හිමිපාණන් මරුද මඩු සිද්ධස්ථානයේ මේ ඓතිහාසික අවස්ථාව සඳහා ගුවන් මගින් එහි ගිය අතර ලක්ෂ සංඛ්‍යාත පිරිසක් එහි එක්රොක්වී සිටියහ. මඩු මාතාවන්ගේ සෙවනේ රටට සාමය, සංහිඳියාව පතා උතුරත් දකුණත් එක්වන්නට කළ අයැදුම සැදැහැ නෙතට කඳුළක් ගෙන එන්නට සමත් විය. ඉතිහාසයේ මුල්වරට සිරිලකට සැපත්වූ සසුනිසුරාණන් නමක උතුරට යෑම මෙවර සනිටුහන් වූ අතර එය සුවිශේෂී මංසලකුණක් ලෙසද දැක්විය හැකිය.

මේ චාරිකාවෙන් අනතුරුව යළි කොළඹ බලා පැමිණි ශුද්ධොත්තම පියතුමා සිය සැලසුම් වෙනස් කරමින් මරදාන මහාබෝධියේ අග්‍රශ්‍රාවක විහාරය බැහැ දකින්නට ගියේය. අඟහරුවාදා කටුනායක ගුවන් තොටපළේදී සසුන් පියා පිළිගැනීමේ අවස්ථාවට එක්වූ මහබෝධියේ අධිපති පූජ්‍ය බානගල උපතිස්ස නායක ස්වාමින් වහන්සේ අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමාට මහබෝධියට වැඩම කරන්නැයි ඇරියුම් කළහ. ඒ අනුව සිය වැඩසටහනට අයත් නොවූ ඒ අංගය එක්කර බදාදා සන්ධ්‍යාවේ අග්‍රශ්‍රාවක විහාරය බැහැ දකින්නට ගිය අවස්ථාවේ මහ සංඝරත්නය පිරිත් සජ්ජායනා කරමින් ශුද්ධොත්තම පියතුමාට සෙත් පැතූ අතර විහාරස්ථානයේ විශේෂ කුටියක තැන්පත් කර තිබෙන බුදුන් වහන්සේගේ අග සව්වන් දෙදෙනාගේ ධාතූන් වහන්සේ එතුමන්ට විවෘත කර පෙන්නූ බව වාර්තා වේ. සාමාන්‍යයෙන් විශේෂ අවස්ථාවලදී පමණක් මේ ධාතූන් වහන්සේ ප්‍රදර්ශනය කරන නමුත් ශුද්ධෝත්තම පියතුමාට ගෞරව පිණිස මේ අවස්ථාව යොදා ගැනීමට පූජ්‍ය බානගල උපතිස්ස හිමියෝ මැලි නොවූහ.

බෞද්ධ විහාරස්ථානයකට වැඩම කළ දෙවන ශුද්ධෝත්තම පියතුමා බවට මේ චාරිකාවත් සමඟින් අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා පත් වූ අතර ඉතිහාසයේ මුල්වරට 1984 දී අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියා සිය තායිලන්ත සංචාරයේදී බෞද්ධ විහාරස්ථානයකට වැඩම කර තිබේ. කාලවේලාව මදකම නිසා විනාඩි 20 කට සීමාවූ මේ චාරිකාවෙන් නික්ම යන්නට සිදුවූ අතර උන්වහන්සේ ඉන්පසු කෙළින්ම කොළඹ අගරදගුරු මැඳුරට වැඩම කළේ අගහරුවාදා යොදාගෙන තිබූ වැඩසටහනට එක්වන්නට නොහැකි වූ හෙයිනි. එහිදී කතෝලික රදගුරු හිමිපාණන් සමග කෙටි පිළිසඳරකට එක්වූ සසුන් පියා කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටි අපෝස්තලික තානාපති කාර්යාලය බලා ගියේ දැඩි වෙහෙසකර දිනයක් නිමා කර ගිමන් හැරීම සඳහාය.

එහිදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, ශිරන්ති රාජපක්ෂ මහත්මිය සමග ගෝඨාභය රාජපක්ෂ මහතාවද හමුවූ බැව් වාර්තාවේ. වතිකාන ප්‍රකාශක ගරු ෆෙඩ්රිගෝ ලොම්බාඩි පියතුමාට අනුව මෙය පුද්ගලික හමුවක් ලෙස සිදුකිරීමට හිටපු ජනාධිපතිවරයාට අවශ්‍ය වූ බැවින් ඒ සඳහා අවකාශ ලබා දී තිබිණ. මේ අතර අඟහරුවාදා සන්ධ්‍යාවේ ගාලුමුවදොර හෝටලයේ පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවේදී හිටපු ජනාධිපතිවරයාට ආරාධනා නොකළේ මන්දැයි කළ විමසුමකට පිළිතුරු දුන් ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා එතුමාට හා ගෝඨාභය රාජපක්ෂ මහතාට ඇරියුම් කිරීමට රජය යෝජනා කළ අවස්ථාවේදී එය යහපත් පියවරක් ලෙස සභාව අනුමත කළ බව පැවසීය.

2015 ජනවාරි 15 වැනිදා පෙරවරුවේ බෝලවලාන ආසියා දේවධර්ම සංස්කෘතික ආයතනයට ගිය සසුන් පියා එය ආසිරි ගැන්වීමෙන් පසු කටුනායක ගුවන් තොටුපළෙන් මෙරටට සමුදී ශ්‍රී ලංකන් ගුවන් යානාවක නැගී පිලිපීනයේ මැනිලා නුවර බලා පිටත් විය.

**ශිරාන් මෛත්‍රී**







2015 ජනවාරි 14 වැනිදාට යෙදී තිබූ භාග්‍යවන්ත ජුසේවාස් තුමන් සාන්තුවරයට එසවීමේ ඓතිහාසික මොහොතට එක්වන්නට දිවයිනේ අට කොන් දිසාවන්ගෙන් සැදැහැවතුන් ගාලු මුවදොර පිටියට ඇදී ආවේ ජනවාරි 13 වැනිදා පටන්ය. අතීතයේ වන්දනා ගමන් විසිඑක්වන සියවසේ නැවත වරක් සාක්ෂාත් කරමින් මී වදයක් සොයා ඇදෙන මී මැසි සේනා මෙන් ජනතාව මුළු රැය පුරා ගාලු මුවදොර පිටියට ඇදුනාහ. රාත්‍රියේ ජනවන්දනා පිළිවෙත් මඟින්ද විවිධ ආගමික වැඩසටහන් මගින්ද ජනතාව ආධ්‍යාත්මික පෝෂණය කරන්නට පියවර රැසක් ගෙන තිබුණි. ජනවාරි 14 වැනිදා පෙරවරු කාලය වන්ම ගාලුමුවදොර පිටිය අතුරු සිදුරු නැතිව පිරීගොස් තිබුණි. පෙරවරු 7.40 වන විට ගාලුපාර ඔස්සේ අශ්වාරෝහක බල ඇණියක් පෙරටු කරගෙන අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා ගාලු මුවදොර පිටිය කරා කැඳවාගෙන ගිය අතර ඉන්පසු විවෘත රියක නැඟී සසුන් පියා ගාලුමුවදොර රොද බැඳ සිටි ජනතාව අතරට ගියේය.

වසර තුන්සියයකට අධික කාලයක් පුරා මෙරට කිතුනු ජන හද සන්තානයේ පැතුම් සපුරාලමින් භාග්‍යවන්ත ජුසේවාස් තුමන් සාන්තුවරයට එසවීමේ ඒ ඓතිහාසික මොහොත දැක බලා ගත්තේ මෙරට සැදැහැවතුන් පමණක් නොවේ. ඉන්දියාවේ ගෝව ප්‍රමුඛ ප්‍රදේශ ගණනාවකින් පැමිණි දහස් සංඛ්‍යාත බැතිමතුන්ද පූජක, රදගුරු හිමිපාණන්ද සීෂෙල්ස් ඇතුලු විවිධ රටවලින් පැමිණි ජනකොටස්ද ලක්ෂ පහකට අධික මේ මහා ජන සන්නිපාතය අතර සිටියහ. මහනුවර රදගුරු ජාතික ජුසේවාස් කාර්යාංශයේ සභාපති අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් විසින් සාන්තුවරයට එසවීමේ අයැදුම ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිවෙත් පුරන්නට සසුන් පියා පියවර ගත්තේය. මීට විසි වසරකට පෙර ගාලුමුව දොර පිටියේදී ම අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියා වන්දනීය ජුසේ වාස් තුමන් භාග්‍යවරයට එසවූ ඒ ඓතිහාසික මොහොත යළි කුළු ගන්වමින් අතිඋතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණෝ භාග්‍යවන්ත ජුසේවාස් තුමන්ව සාන්තුවරයට එසවූහ. ඉන්පසු දිව්‍ය පූජා පිළිවෙත පැවැති අතර ජනතාව දැඩි භක්තියකින් ඊට හවුල් වන අයුරු දැක ගන්නට ලැබිණි.

එය නිමවීමෙන් අනතුරුව සවස අවධානය යොමුව තිබුණේ මරුද මඩු සිද්ධස්ථානය කරාය. ශුද්ධොත්තම



Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55



























Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55




























සේයා : තිළිණ අලහකෝන් / සාගර ලක්මාල් ද මෙල් හා අන්තර්ජාලයෙන්

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55




# සාමය උදාකරනු සඳහා ආගමික භේදයන් දුරලීම වැදගත්

## ගාලු මුවදොර පිටියේ සාන්තුවර මෙහෙයේදී සසුන් පියා පවසයි



**'අපේ දෙවිඳුන්ගේ ගැලවීම ලොවේ සීමාන්තයෝ දකිති' (යෙසායා 52:10)**

අද දින පළමු කියවීමේ අප සවන් දුන් විශිෂ්ට අනාවැකියයි, මේ. ලෝකයේ සියළු සීමාන්තයන්ට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුබාරංචිය දේශනා කරන්නැයි යෙසායා දිවැසිවයා කල් ඇතුවම ප්‍රකාශ කරයි. මේ අනාවැකිය අප හට විශේෂ අරුතක් ගෙන එන්නේ සුබාරංචියේ සුවිශිෂ්ට ධර්ම ප්‍රචාරකයකු වන ශු. ජුසේවාස් මුනිතුමන් ශුද්ධවරයට ඔසවනු ලැබීම අපි විසින් මේ අවස්ථාවේදී සිදුකරනු ලබන නිසාය. සභා ඉතිහාසයේ අනෙකුත් අසංඛ්‍ය ධර්ම ප්‍රචාරකයින් මෙන්, සියළු ජාතීන් තම ශ්‍රාවකයන් කර ගන්නැයි (මතෙව් 28:19) උත්ථාන වූ කිතු සමිඳුන් දුන් නියෝගයට එතුමෝද ප්‍රතිචාර දැක්වූහ එතුමන්ගේ වදන්, ඊටත් වැඩියෙන් එතුමන්ගේ ජීවිත ආදර්ශය තුළින් එතුමෝ මේ දේශයේ ජනතාව විශ්වාසය කරා රැගෙන ගියහ. දෙවිඳුන්ගේ ශුද්ධ ජනතාව අතරේ අප හට උරුමයක් ලබාදෙන්නේ මේ විශ්වාසයයි. (ක්‍රියා 20:32)

ශු. ජුසේ වාස් මුනිතුමන් තුළින් අප දකින්නේ ශ්‍රී ලංකා වාසින් වෙත දෙවිඳුන් දක්වන කරුණාව හා ප්‍රේමයයි. එහෙත් ශුද්ධත්වයෙන් වැඩි වර්ධනය වනු පිණිස හා එතුමා සිය දිවිය කැප කළ සමඟි සන්ධානයේ සුබාරංචි පණිවුඩයට සාක්ෂි දරනු පිණිස සුබාරංචි ගමන් මගේ නොපසුබටව ගමන් කරන්නට අභියෝගයක්ද එතුමන් තුළින් අපි දකිමු.

තමන් උපන් ගෝවා ප්‍රදේශයේ ඔරතෝරියාන නිකායට අයත් පූජක තුමකු වූ ශු. ජුසේවාස් මුනිතුමා මේ රටට සැපත් වූයේ ධර්මදූතික උද්‍යෝගයෙන් හා එහි ජනයා වෙත ඉමහත් ප්‍රේමයෙන් දැල්වී ගිය සිතකිනි. ආගමික තාඩන පීඩන හේතුවෙන් යාචකයකු සේ වෙස්වලාගත් එතුමා තම පූජක වත්පිළිවෙත් සිදුකළේ විශ්වාසිකයන් රහසේ මුණ ගැසෙමින් බොහෝවිට රාත්‍රි කාලයේදීය. සැමතින්ම වටකරනු ලැබ සිටි කතෝලික ජනතාවට එතුමන් දැරූ ප්‍රයත්නයන් ආධ්‍යාත්මික හා සදාචාරාත්මක සවියක්ම විය. රෝගින්ට හා දුක්විඳන්නන්ට සේවය කිරීම එතුමනගේ විශේෂ ආශාව විය. වසූරිය වසංගතය පැතිර තිබූ සමයේ එතුමා එම රෝගින්ට කළ උපස්ථාන ගැන මහනුවර රජතුමා කෙතරම් පැහැදුනාද කිවහොත් එතුමනට තම සේවාවන් ඉටු කිරීමට වැඩි නිදහසක් ලැබුනි. මහනුවර සිට දිවයිනේ අනෙකුත් පෙදෙස් කරා යන්නට එතුමනට හැකි විය. ධර්ම ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ම වැයවෙමින් දිවි ගෙවූ එතුමා පනස් නවවැනි වියේදී දිවියට සමුදුන්නේ තම ශුද්ධවන්ත භාවයට ගරු බුහුමන් ලබමිනි.

ශු. ජුසේ වාස් මුනිතුමා බොහෝ හේතුන් මුල් කොට තවදුරටත් අප හට ආදර්ශයක් මෙන්ම ගුරුවරයකුද වන නමුත් කරුණු තුනක් ඉස්මතු කර දක්වන්නට කැමැත්තෙමි.

ප්‍රථමයෙන්ම, එතුමා ආදර්ශවත් පූජකතුමෙක් විය. ජුසේ වාස් මුනිතුමන් මෙන් දෙවිඳුන්ට හා අසල්වැසියාට සේවය කරන්නට කැප වූ බොහෝ පූජකවරුද, පැවිදිවරුන් හා පැවිදිවරියෝ අද අප අතර සිටිති. නොවරදින මාර්ගෝපදේශකයකු ලෙසින් ශු. ජුසේවාස් මුනිතුමන් වෙත හැරෙන්නැයි මම ඔබ එකිනෙකා දිරිගන්වමි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේව සැම තැනෙකම දැන ගන්නට සැලැස්වීමත්, උන්වහන්සේට ප්‍රේමකරනු ලැබීමත් පිණිස සීමාන්තයන් කරා ගමන් කරන්නේ කෙසේද යන්න එතුමෝ අප හට කියා දෙති. එතුමා සුබාරංචියද අපගේ නායකයින් හට කීකරු වීමද දෙවිඳුන්ගේ සභාව වෙත ප්‍රේමනීය සැලකිල්ලද (ක්‍රියා 20:28) යන කරුණු වලදී ඉවසිලිවන්ත ලෙසින් පීඩා විඳීමේ ආදර්ශයක්ද වේ. අප මෙන්ම ශු. ජුසේ වාස් මුනිතුමන්ද දිවි ගෙවූයේ සීඝ්‍ර හා ගැඹුරු පරිවර්තන යුගයකයි. කතෝලිකයින් සුළුතරයක් වූ අතර නොයෙක් විට ඔවුහු ඇතුළතින් භේදභින්න වී සිටියෝය. ඇතැම් විට පිටස්තරයෙන් එදිරිවාදිකම්ද තාඩන පීඩන පවා දක්නට ලැබුනි. එසේ වූවත් එතුමා කුරුසපත් කිතු සමිඳුන් සමඟ නිබඳව යැදුමින් බද්ධ වී සිටි හෙයින් සියළු ජනයින් හට දේව කරුණාව හා උන්වහන්සේගේ සමඟිසන්ධානයේ ප්‍රේමය පිළිබඳව ජීවමාන සලකුණක් වන්නට එතුමනට හැකි විය.

දෙවනුව, ශු, ජුසේවාස් මුනිතුමා අප හට පෙන්වා දෙන්නේ සාමය උදාකරනු සඳහා ආගමික භේදයන් දුරලීමේ වැදගත්කමයි. දෙවිඳුන් වෙත එතුමා දැක්වූ පූර්ණ ප්‍රේමය නිසා තම අසල්වැසියාට ප්‍රේමකරන්නට එතුමාට හැකියාව ලැබුණි. දුගීන්ට එතුමෝ පිහිට වූහ. ඔවුන් කවුද, ඉන්නේ කොතැනද යන්න ප්‍රශ්නයක් කරගත්තේ නැත. ශ්‍රී ලංකාවේ වත්මන් කිතු සසුනේ පිබිදීමක් ඇති වන්නට එතුමන්ගේ ආදර්ශය අඛණ්ඩව පිටිවහලක් වන්නේය.. සභා මාතාව සතුටින් හා නොමසුරුව සමාජයේ සියළු සාමාජිකයන් හට සේවය කරන්නීය. තම පාසල්, රෝහල්, සායන හා අනෙකුත් බොහෝ දයා සේවාවන් ඇසුරින් ඇය සලසන සේවාවේදී ජාතිය, ලබ්ධිය, කුලය, සමාජ තත්ත්වය හෝ ආගම ප්‍රශ්නයක් කරගන්නේ නැත. ඊට ප්‍රතිඋපකාර වශයෙන් ඇය ඉල්ලා සිටින එකම දෙය නම් මේ දූත මෙහෙවර ඉටුකිරීමේ නිදහසයි ආගමික නිදහස මූලික මානව අයිතියකි.. තනි තනිව හෝ අන්‍යයන් හා එක්ව සාමය සොයා යාමේ හා බියගැන්වීමෙන් හා බාහිර බලපෑමෙන් තොරව ඔහුගේ හෝ ඇයගේ ආගමික විශ්වාසය එළිපිටම ප්‍රකාශ කිරීමේ කටයුත්තේදී සැම පුද්ගලයකුටම නිදහස තිබිය යුතුය. ශු, ජුසේවාස් මුනිතුමන්ගේ දිවියෙන් ඉගැන්වෙන ලෙස සැබෑ දේව වන්දනාව ඵල දරන්නේ වෙනස්කම් කිරීම, වෛරය හා හිංසාව තුළින් නොව දිවියේ පාරිශුද්ධත්වයට ගරු කිරීම, අන්‍යයන්ගේ අභිමානයට හා නිදහසට ගරු කිරීම හා සැමගේ සුබසෙත වෙනුවෙන් ප්‍රේමයෙන් කැපවීම තුළිනි..

අවසන් වශයෙන්, ශු, ජුසේවාස් මුනිතුමා අප හට ධර්මදූතික ජ්වලිතකම පිළිබඳ ආදර්ශයක් ලබාදෙයි. එතුමා සිරිලකට සැපත් වූයේ කතෝලික සැදැහැ සංඝයට සේවය කිරීමට වූවත් එතුමන්ගේ ධර්මදානිය දයාව සියල්ලන් කරා විහිදී ගියේය, තම නිවෙස, පවුල, තමනට සුපුරුදු වටපිටාවේ සුව පහසුව පසෙකලා තමන්ට යන්නට සිදුවූ කවර හෝ ස්ථානයකට වුවද ගොස් ක්‍රිස්තුන්වහන්සේ ගැන කථා කරන්නට තමන් ලද කැඳවීමට එතුමෝ පිළිතුරු දුන්හ. ගෞරවය, කැපවීම, නොපසුබට උත්සාහය හා බැහැපත්කම ඇසුරින් බහු ආගමික පසුබිමක් තුළ සුබාරංචියේ සත්‍යතාවය හා අලංකාරය හෙලිකරන ආකාරය ගැන ශු, ජුසේවාස් මුනිතුමෝ දැන සිටියහ. ජේසුස් වහන්සේව අද අනුගමනය කරන්නන් ගත යුතු මගද මෙයමයි. ශු, ජුසේ වාස් මුනිතුමන් තුළ තිබූ ජ්වලිතකම හා ධෛර්යය ඇතිව සමාජයට පියංමකරන්නට අප කැඳවනු ලබන නමුත් එහිදී එතුමන්ගේ සංවේදිබවත්, අන්‍යයන් වෙත එතුමන් තුළ වූ ගෞරවයත්, මේ දේ ගොඩනැගීමේ හැකියාව ඇති වරප්‍රසාදයේ එම වදන (ක්‍රියා 20:32) ඔවුන් සමඟින් බෙදාගැනීමේ එතුමන්ගේ අභිලාෂයත් තිබිය යුතුය. ධර්මදානයේ ශ්‍රාවකයන් වන්නට අපි කැඳවනු ලබමු. හිතාදර සොයුරි සොයුරියනි, ශු, ජුසේවාස් මුනිතුමන් ආදර්ශයට ගනිමින් මෙරටේ කිතුනුවන්ට විශ්වාසයේ ස්ථිරව සිටිමින් ශ්‍රී ලංකා ජන සමාජයේ සාමයට, සාධාරණත්වයට හා සමඟි සංධානයට වැඩි වැඩියෙන් දායකත්වයක් ලබාදෙන්නට හැකිවේවායි දෙවිඳුන් යදිමි. ක්‍රිස්තුන් වහන්සේ ඔබගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි, ශු, ජුසේවාස් මුනිතුමන් ඔබට කියා දෙන්නේ මෙයයි, සභාව ඔබෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. ලොව පුරා සභාව එක්ව සමිඳුන්ට හට නව ගීයක් ගයන්නටත් උන්වහන්සේගේ මහිමය පොළොවේ සියළු සීමාන්තයන් කරා ප්‍රකාශ කරන්නටත් ඔබට හැකිවනු පිණිස ඔබ සැවොම අපගේ නව සුද්ධවරයාණන්ගේ යැදුම් වලට භාර කරමි.



සමිඳුන් උතුම්ය. උන්වහන්සේට බොහෝ පැසසුම් හිමිවිය යුතුය.. (ගීතා 96:1-4) ආමෙන්

ඥානාර්ථ ප්‍රදීපය
ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 18 ඉරිදා




# අන්‍යෝන්‍ය අවබෝධයේ හා තේරුම් ගැනීමේ පාලම් අර්බුදයෙන් පීඩාවට පත් පාර්ශ්වයන් අතර තනන්නත්, දීමේ හා ලබාගැනීමේ මඟකට පිවිසීමටත් අපව ආසිරි ගන්වන්න

## ගාලුමුවදෙර පිටියේ කාදිනල් හිමිපාණන්ගේ තුති පිදීමේ දෙසුම

අතිඋතුම් ශුද්ධෝත්තම පියතුමනි, ශ්‍රී ලාංකික පුරවැසියන් සහ කතෝලික සභාවේ සාමාජිකයන් වශයෙන් අදදින අප මධ්‍යයට වැඩම කරන ඔබවහන්සේව උතුරා ගලා යන ප්‍රීතියෙන් සහ පීතෘක සෙනෙහසින් යුතුව පිළිගන්නෙමු. අප ජනතාවගේ සරල සහ අසමසම විශ්වාසය පිළිබඳවත්, ඔබවහන්සේ වෙත දක්වනු ලබන යටහත් පහත් භාවයෙන් යුතු ගෞරව බහුමානය පිළිබඳවත් මේ බිමට පා තැබූ මොහොතේ පටන් අත්දකින්නට ඔබවහන්සේටත් අවස්ථාවක් ලැබෙන්නට ඇතැයි යන්න මට සහතිකය. මෙහිලා ඔබවහන්සේ අගයන ලොව වටා වෙසෙන දසලක්ෂ සංඛ්‍යාත පිරිස් අතරට එක්වෙමින් ශ්‍රී ලාංකික අපගේම ජනතාව සියලු ආගම්, ජාති සහ සමාජ වර්ණ නොතකා අපගේ දර්ශනීය කුඩා රටට ඔබවහන්සේගේ මේ ධර්මදූතික සංචාරය හද පත්ලෙන් නැගෙන ගැඹුරුවූ ගෞරවයෙන් හා ප්‍රේමයෙන් පිළිගන්නට සැදී පැහැදී සිටින බව ප්‍රකාශ කළ යුතුමය.





ඔබවහන්සේ මේ ධරණී තලයට පා තැබීමේ ඒ ආනන්ද ජනක තිළිණයට අමතරව ඔබවහන්සේ අපට සාන්තුවරයකු ලෙස සාන්ත ජුසේ වාස් මුනිඳුන් තිළිණ කර දුන්හ. මේ තිළිණය අපව සැබැවින්ම මහත් ආනන්දයට පත්කළ අතර, ශ්‍රී ලංකාව සතුව දුන්
තමන්ගේම සාන්තුවරයකු සිටින අතර, ගෝවා පුරයේ අභිමානය සහ දෙවියන් වහන්සේ වෙතින් ශ්‍රී ලංකාව ලද අනගිතම මිණිකැටයකි.

මේ අමිලවූ තිළිණය උදෙසා අප ඔබවහන්සේට තුති පුදන අතර උන්වහන්සේගේ ජීවිතය සහ මේ ධර්ම තලයේ සේවාව ඔස්සේ ඉතා දුෂ්කර හා පීඩන සමයක කතෝලිකයන්ගේ විශ්වාසය සුරක්ෂිත කරගත් අවසානයේදී දේව ආදරයේ නොනිමි තිළිණය සිය ඉතිහාසය තුළ අපට උරුම කරදෙන්නට එතුමා සමත්විය. දෙවියන් වහන්සේ සැබැවින්ම මේ ශුද්ධවන්ත පුද්ගලයාට ස්වකීය ආදරණීය මවුබිමත්, ජනතාවත් හැරදමා නොදන්නා දේශයකට සම්ප්‍රාප්ත වීමට මඟ සැලසුවේ හරියට ආබ්‍රහම්ට මෙන්, අප මුතුන් මිත්තන්ගේ විශ්වාසය සුරක්ෂිත කරනු පිණිසය. අගය කියා නිමකළ නොහැකි අමිල තිළිණයක්වූ මේ ගෝව පුත්‍රයා උදෙසා අපි ගෝව සභාවට තුති පුදන්නෙමු. මේ අවස්ථාවට එක්වීමට ඔවුන්ගේ පේත්‍රියාක් තුමන් පෙරටුව එකී ජීවමාන සභාවේ අති විශාල පිරිසක් මෙහි පැමිණ සිටින අතර සැම දෙනාවම මහත් උදාර හදවතින් යුතුව පිළිගන්නට කැමැත්තෙමි.

සුදුතුම් පියාණනි, ඉකුත් වසරේ පෙබරවාරි 8 වැනිදා රෝමයේ සාන්ත පීතර බැසිලිකාවේදී ඔබ වහන්සේ විසින් පවත්වන ලද දෙසුමේදී අපට මෙසේ ප්‍රකාශ කැරිණ. 'ඉන්දියානු සාගරයේ මුතු ඇටය ලෙස විරුදාවලි ලබා තිබෙන්නේ එහි සොබාවික සෞන්දර්ය සහ එහි හැඩය නිසාවෙනි. මුතු ඇටය කඳුළක හැඩය ගනී' මුතු ඔබවහන්සේ සඳහන් කළ පරිදිම බෙල්ලාගේ කඳුලකින් තැනෙන්නකි. ගෙවී ගිය අතීතයේ දී අප රටේ අභ්‍යන්තර වියවුල් නිසා බොහෝ පුද්ගලයන් සහ අප සම්පත් විශාල වශයෙන් විනාශ වීම නිසා අපි බොහෝ කඳුළු සැලුවෙමු.

එම දුක්බර අතීතයෙන් නැගී සිටින්නට අප තවමත් වෙර වෑයම් කරන අතර අපගේ ජනතාවට සැබෑ සංහිඳියාවේ, සාමයේ සහ සංවර්ධනයේ යුගයක් උදාකිරීමට බලාපොරොත්තුවෙන් සිටිමු. මේ ගමන් මඟ ඉතා දුෂ්කරය. ඔබවහන්සේගේ යැදුම් සහ ආශිර්වාදය මෙන්ම පීතෘක මඟ පෙන්වීම එහිලා අපට අවශ්‍යකර තිබේ. තවදුරටත් එහිලා ඔබවහන්සේ අප වෙනුවෙන් යදින බවට වූ සහතිකයට අපි ඔබවහන්සේට තුති පුදන්නෙමු. තුවාල වූ හදවත් සුවපත් කර ගැනීමේ සැබෑ මඟ සොයා යන ගමනේදී එකිනෙකා කමා කරන කමාව ඉල්ලන, අර්ථ විරහිත ප්‍රචණ්ඩත්වය දුරුකර සමාව දෙන, කණගාටුදයක අතීතය අමතක කර අන්‍යෝන්‍ය අවබෝධයේ හා තේරුම් ගැනීමේ පාලම් අර්බුදයෙන් පීඩාවට පත් පාර්ශ්වයන් අතර තනන්නත්, දීමේ හා ලබාගැනීමේ මඟකට පිවිසීමටත් මඟ හෙළි පෙහෙළි කර ගැනීමට ශක්තිය ගොඩනඟා ගැනීමට ඔබවහන්සේ කාරුණිකව අපට සහය වන්නැයි අපි ඉල්ලා සිටින්නෙමු. මේ අරමුණ කරා ළඟාවීමට අප තව බොහෝ දුර යා යුතුව තිබේ. මෙහිදී ඔබවහන්සේගේ විශේෂි ඉගැන්වීම් වලට අනුව ආගම් මෙවැනි වැටකඩොළු ජයගෙන එකිනෙකා වෙත උදව් කිරිමට යොමු කරයි. අපගේ සදදරණීය සාන්ත ජුසේවාස් මුනිඳුන්ට ශ්‍රී ලංකාවට ඉක්මනින් සාමය උදාකරදීමේ මහා ප්‍රාතිහාර්ය උදෙසා ස්වර්ගයේ සිට මැදිහත්වන්නැයි අපි යාච්ඤා කරන අතර මේ



ඉලක්කයට ඉක්මනින් ළඟාවී සැබෑ ප්‍රගතියක් සහ ප්‍රීතියක් සියලු වෙනස්කම් දුරලා ජනතාවට ලබාගැනීමටත් අපි ඉල්ලා සිටින්නෙමු. ශුද්ධෝත්තම පියතුමනි, අප දේශය ලෝකයේ ශ්‍රේෂ්ඨ ආගම් වන බෞද්ධ හින්දු, ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ඉගැන්වීම් වලින් ආශිර්වාද ගැන්වී ඇති නිසා ශීලධාර්මික සහ අධ්‍යාත්මික ශක්තීන් මෙන්ම එහි උදාරත්වය ඔස්සේ එවන් සාමයක් ගොඩ නංවාගැනීමට එකිනෙකා හා අත්වැල් බැඳගනිමින් සංහිඳියාවේ, විශ්වාසයේ සහ පරස්පරතාවයේ දැක්ම ජය ගත යුතුව ඇත. මේ විසඳුම උදෙසා ශුද්ධෝත්තම පියතුමනි, අප ආසිරි ගැන්වුව මැනව. ඔබවහන්සේ අප මැදට වැඩම කිරිම ගැන තුති පුදන අතරම ඔබවහන්සේගේ පීතෘක සහ අපෝස්තලික ආශිර්වාදය ශ්‍රී ලංකාව නම් අප සදදරණීය මවුබිම මත සහ එහි වෙසෙන සියලු ජන කොටස් වෙත දනය කරන මෙන් ඉල්ලා සිටිමි. ස්තූතියි



Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

ඥානාර්ථ ප්‍රදීපය




# මන්නාරමේ ගලාගිය ප්‍රාණ පරිත්‍යාගී රුධිරය මුළු උතුරුකරය පුරා මෙන්ම මුළුමහත් රට පුරාත් කිතු දහම සරුවට වැඩෙන්නට විශ්වාසයේ සරු බීජ බවට පත්විය

## මරුද මඩු පුදබිමේදී මන්නාරම රදගුරු හිමිපාණෝ ප්‍රකාශ කරයි



**අතිඋත්තම ශුද්ධෝත්තම පියතුමනි,**

අද දින රදගුරු, පූජක, පැවිදි සහ ගිහි ජනතාව මෙහි එක්රොක්වී සිටින්නේ ඔබවහන්සේව පීතෘක සෙනෙහසින් පිළිගැනීමටයි. ඔබවහන්සේ අපගේ රට වන ශ්‍රී ලංකාවට පැමිණ සිටින්නේ සත්‍යය, යුක්තිය සහ සංහිඳියාව පදනම් කරගත් සාමයේ පණිවුඩකරුවාණන් නමක ලෙසයි. අප දෙවිපියාණන් වහන්සේ හා අසීසියේ සාන්ත ප්‍රැන්සිස් තුමන්ගේ මඟ යමින් දිළිඳුන් හා පීඩා විඳින්නන් වෙත පාන ඔබවහන්සේගේ අමිල ප්‍රේමයට අපි තුති පුදමු.

ආසියාවේ මුල්ම ප්‍රාණපරිත්‍යාගිවරය සිදුවූ බිම ලෙස මන්නාරම දෙවියන් වහන්සේ ආසිරි ගැන්වූහ. වර්ෂ 1544 දී අප රටේ කතෝලික දහමේ බීජය එල දරූ මුල්ම අවස්ථාවේදී හයසියයකට අධික කතෝලික සැදැහැවතුන් පිරිසක් එවකට උතුරේ යාපනය රජුගේ නියෝගය මත ජීවිත පූජා කළහ. මන්නාරමේ ගලාගිය ප්‍රාණ පරිත්‍යාගී රුධිරය මුළු උතුරුකරය පුරාමෙන්ම මුළුමහත් රට පුරාත් කිතු දහම සරුවට වැඩෙන්නට විශ්වාසයේ සරු බීජ බවට පත්විය.

පුරා වසර 400 කට වැඩි ඉතිහාසයකට නෑකම් කියන මේ සිද්ධස්ථානය එදා මහ වන මැද පිහිටා තුබූ අතර ඕලන්ද අධිරාජ්‍යවාදීන්ගේ කිතුනු සංහාරය මැද මාන්තෙයි සිට මේ ස්ථානයට එය රැගෙන එන්නට සිදුවිය. ජපමාලයේ අප ස්වාමිදූවට කැප කළ මේ සිද්ධස්ථානය විශ්වාසය සුරැකීමෙහිලා අති සුවිශේෂී කාර්යය භාරයක් ඉටුකර ඇති අතර අපගේ රට පුරා








වෙසෙන සියලු බැතිමතුන් ජාති, ආගම් හෝ භාෂා බේදයකින් තොරව ඉකුත් ශත වර්ෂ හතරේදී මේ වටා බැති සිතින් එක් රොක් වූහ.

මරිය බැතිය පතුරාලන සිද්ධස්ථානයක් වශයෙන් මෙය අප රදගුරු වසමේ පූජක සහ පැවිදි දේව කැඳවීම් ප්‍රවර්ධනයසඳහා තෝතැන්නකි. අගෝස්තු 15 වැනිදා මෙහි පැවැත්වෙන දේවමාතාවන්ගේ ස්වර්ගාරෝපන මංගල්‍යයට ලක්ෂ හයකට අධික වන්දනා කරුවෝ මෙහි පැමිණෙති. ඊට අමතරව මාසිකව පැවැත්වෙන මංගල්ලයන්ට සහ සති අන්තයන් වලදී වන්දනා කරුවෝ විශාල පිරිසක් මෙහි පැමිණෙති. ඔබවහන්සේ මේ සිද්ධස්ථානයට සම්ප්‍රාප්තවීම එම සිද්ධස්ථානයටත්, එහි වන්දනාකරුවන් සෑම සියලු දෙනාටමත් සුවිශේෂ වූ ආශිර්වාදයකි. ඔබ වහන්සේගේ චාරිකාවත්, ඔබවහන්සේගේ යාච්ඤාවනුත් අපගේ මවුබිමට සාමය සහ සමෘද්ධිය රැගෙන එන්නට හේතුවන්නේය. ශුද්ධෝත්තම පියතුමා වෙනුවෙන් අප සියලු දෙනා මහත් විශ්වාසයකින් හා භක්තියකින් යුතුව දිනපතා යාච්ඤා කරන අතර මේ අවස්ථාවේදී අප හදවත් වල ගැඹුරුම තැනින් නැගෙන පීතෘක යටහත් පහත් භාවයෙන්, ගරුත්වයෙන් හා ප්‍රේමයෙන් ඒ යැදුම් පුද කරන්නෙමු. ඔබවහන්සේට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය සහ අප ස්වාමිදූවගේ මධ්‍යස්ථකම තුළ සභාව හා සමස්ත ලෝකය දූතික ප්‍රබෝධයෙන් පුරවාලන්නට වරම් ලැබේවා!

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55




# දේවමාතාව හා එකමුතුව අපෙන් තුරන් වූ සමගිය යළි ගොඩනගන්නැයි ඉල්ලා සිටිමු

## මරුද මඩු ජපමාල සිද්ධස්ථානයේ සුදුතුම් පිය මරිය යැදුම



**දයාබර සහෝදර සහෝදරියනි,**

අප සිටින්නේ අප අම්මාගේ නිවහනේය. මෙන්න එතුමිය ඇයගේ නිවහනට අප පිළිග න්නීය. මඩු අප ස්වාමිදූ සිද්ධස්ථානයේදී සෑම වන්දනාකරුවකුටම සිය නිවහනේ සිටින්නාක් බඳු හැඟීමක් ඇති වේ. මෙහිදී මරිය වහන්සේ අපව ස්වකීය පුත්‍රයාණන් වූ ජේසුස් ස්වාමින් වහන්සේ තුළට රැගෙන යන්නාහ. මෙහිදී ශ්‍රී ලාංකිකයන්, දමිළ සහ සිංහලයෝ එක ලෙසින් එක පවුලක සාමාජිකයන් බවට පත්වන්නාහ. ඔවුහු දේව මාතාවන්ට ස්වකීය ආනන්දයන් සහ දුඃඛවේදනාවන් ද, තම තමන්ගේ බලාපොරොත්තු සහ අවශ්‍යතාවයන් ද පවරා දෙන්නාහ. ඕ තුමියගේ නිවහනේ දී ඔවුහු සුරක්ෂිත බව අත්දකින්නාහ. දෙවියන් වහන්සේ තමන්ට ඉතා සමීප බව දන්නා නිසාත්, උන්වහන්සේගේ ප්‍රේමය තමන් අත්දකින බව හැගෙන නිසාත්, ඔවුහු උන්වහන්සේගේ මෘදු කරුණාව හඳුනා ගනිති. අද මෙහි එක් රොක් වී සිටින පවුල් දීර්ඝකාලීන අර්බුදය නිසා, බරපතල දුඃඛ දොම්නසයන්ට මුහුණ පෑම නිසා ශ්‍රී ලංකාවේ හදවත ඉරා දමා විවර කරන්නට සමත් විය. උතුරේ මෙන් දකුණේ ද බොහෝ පුද්ගලයෝ එක ලෙසින් බිහිසුණු ප්‍රචණ්ඩත්වයෙන් සහ ලේ වැගිරීම් වලින් ඉකුත් වසර ගණනාවක් තිස්සේ ඝාතනයට ලක්වූහ. කිසිදු ශ්‍රී ලාංකිකයකුට මේ ස්ථානයේ සිදුවූ දුඃඛදායක සිද්ධීන් අමතක කළ නොහැකි අතර, ශ්‍රී ලංකාවේ ඉපැරණි කිතුනුවන් මෙහි රැගෙන ආ දේව මාතාවන්ගේ ආශ්චර්යමත් ප්‍රතිමාව එතුමියගේ සිද්ධස්ථානයෙන් එය රැගෙන ගිය අන්දමද කිසිදු අමතක නොවේ.

එහෙත් අප ස්වාමිදුව නිරන්තරයෙන් ඔබ සමඟ සිටින්නීය. ඕ තුමිය සෑම නිවහනකම, සෑම තුවාල වූ පවුලකම යළි සාමකාමී එකමුතුවීමකට බලා හිඳින සැමට දයාබර මාතාව වන්නීය. අද දින අප එතුමියගේ රැකවරණය තුළ ශ්‍රී ලංකාවේ ජනතාව අතීතයේ හා වර්තමානයේ දී බොහෝ අනතුරු වලින් මුදා ගත් නිසා තුති පුදන්නෙමු. දේව මාතාව කිසිදිනක මේ බබළන දූපතේ ඇයගේ දරුවන් අමතක නොකළාය. එදා ස්වකීය පුත්‍රයාණන්ගේ කුරුස ගස ළඟින් එක මොහොතක්වත් ඉවත්ව නොගිය ලෙසින් ශ්‍රී ලංකාවේ වේදනා විඳින දරුවන් අමතක නොකර ඔවුන්ගේ පැත්ත ගත්තාය.

අද දින අප ස්වාමිදුවගේ ඒ මැදිහත්කම උදෙසා තුතිපිදිය යුතුය. බොහෝ දුඃඛ පීඩාවන්, ප්‍රචණ්ඩත්වයන් සහ විනාශ වීම් මධ්‍යයේ ඕතුමිය අපව නොකඩවා ජේසුස් ස්වාමින් වහන්සේ වෙතට රැගෙන යෑම ගැනත්, උන්වහන්සේගේ බලයට පමණක් විවර වූ තුවාල සුවපත් කර, කැඩී බිඳී ගිය හදවත් වලට සාමය උදාකළ හැකිය. එහෙත් එතුමිය වෙතින් දෙවියන් වහන්සේගේ කරුණාව අපට ලබා දෙන්නට මැදිහත් වන්නැයි ඉල්ලා සිටිය යුතුය. මේ බිමේ දන්නා අපගේ පාපයන් සහ සියලු නපුර බෙදා වෙන් කරන්නට වරප්‍රසාද ඉල්ලා සිටිමු.

එය සිදුකිරීම එතරම් පහසු දෙයක් නොවේ. ඊට හැකිවන්නේ කුරුසියේ ආලෝකය මැද නපුරා අප සමඟ වෙසෙමින්, අපගේම කොටස්කරුවකු වෙමින් ඇති අන්දම සැබෑ පශ්චත්තාපයෙන් සහ සිත් හැරීමෙන් අප අවබෝධ කර ගන්නේ නම් පමණි. එහිදී පමණක් එකිනෙකා තුළ සැබෑ පසුතැවිල්ල, සැබෑ කමා දානයන් පිරිනැමීමට හා ලබා ගැනීමට අපට හැකිය. මේ දුෂ්කර ව්‍යායාමයේදී කමා දානයට සහ සාමය සෙවීමට දේව මාතාව නිරන්තරයෙන් මෙහි සිට අපව දිරිගන්වමින් ද, අපට මඟ පෙන්වමින්ද, අපට නායකත්වය දෙමින්ද සිටින්නීය. ඕ තුමිය ස්වකීය පුත්‍රයාණන්ගේ මිනීමරුවන්ට කුරුසිය පාමුල දී කමාව දානය කර, උන්වහන්සේගේ ප්‍රාණය නිරුද්ධ සිරුර සිය දෑත් මත හොවා ගත්තාය. එහෙයින් දැන් ඕතුමියට ශ්‍රී ලාංකිකයන් විශිෂ්ටතම වූ සංහිඳියාවකට, දෙවියන් වහන්සේගේ කමාව සහ දයා කරුණාව නමැති ආලෝකයෙන් සියලු දෙනා හට සැබෑ සුවයක් අත්දැකීම සඳහා මඟ පෙන්වීමට අවැසි කර තිබේ.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ සිංහල හා දමිළ බස කතා කරන ජන කොටස් වශයෙන් අප දේවමාතාව හා එකමුතුව එතුමියගේ මැදිහත්කමින් අපෙන් තුරන් වී ගොස් ඇති එකමුතුව යළි ගොඩනගන්නැයි යාච්ඤා කරමු. යුද්ධය නිමා වූ සැනින් දේව මාතාවන්ගේ ආශ්චර්යවත් ප්‍රතිමාව මඩු සිද්ධස්ථානය කරා නැවත රැගෙන පැමිණි අතර ශ්‍රී ලංකාවේ දූ පුතුන් ලෙස දෙවියන් වහන්සේගේ නිවහන කරා සංහිඳියාවේ සහ සහෝදරත්වයේ නැවුම්වූ ස්ප්‍රීතුවෙන් පූර්ණ වී පැමිණෙන්නැයි ඉල්ලා අපි යාච්ඤා කරමු.

දයාබර සහෝදර සහෝදරියනි, ඔබ සියල්ලන් සමඟ මරිය මාතාවන්ගේ නිවහනේ සිටින්නට ලැබීම ගැන මම ප්‍රීතිවෙමි. අපි එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරමු. ඒ සියල්ල මැද මේ සිද්ධස්ථානය නිරන්තරයෙන් යැදුමේ ගෘහයක් සහ ස්වර්ගීය සාමයේ ස්ථානයක් වන්නැයි අපි ඉල්ලා සිටිමු.

මඩු අප ස්වාමිදුවගේ මැදිහත්කමින් සංහිඳියාවේ, යුක්තියේ සහ සාමයේ ශක්තිමත් අනාගතයක් මේ ආදරණීය මවුබිමේ වෙසෙන සියලු දූ දරුවන්ට ලැබේවා! ආමෙන්








# ජනාධිපතිවරණ උණුසුම සිසිල් කළ සසුන් පිය ලංකා ගමන

**ශිරාන් මෛත්‍රී විසිනි**

අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා ශ්‍රී ලංකාවේ සිය දෙදින චාරිකාව නිමකර ඉකුත් බ්‍රහස්පතින්දා පෙරවරු 9.00 ට කටුනායක අන්තර් ජාතික ගුවන් තොටුපළෙන් පිලිපීනයේ මැනිලා නුවර බලා පිටත් විය. විශ්වීය සසුන් ධූරාවලියේ 266 වැනි සසුනිසුරාණන් වූ අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියා මෙරටට සැපත්වූ තෙවැනි ශුද්ධොත්තම පියතුමන් විය. මීට පෙර 1970 දෙසැම්බර් 04 වැනිදා ශුද්ධාසනයේ 262 වැනි සසුන් නායකයාණන් වූ අතිඋතුම් සවැනි පාවුළු සසුන් පියා පිලිපීනයේ මැනිලා නුවර බලා චාරිකා කරන අතර වාරයේදී පැය තුනකට අඩු කාලයක් සඳහා කටුනායක ගුවන් තොටුපළට සැපත් වූ අතර, 1995 ජනවාරි 20, 21 දිනවලදී 264 වැනි සසුන් පියාණන් වූ අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධොත්තම පියතුමා (දැන් සාන්තුවර) ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයාණන් වූ වන්දනීය ජුසේ වාස් පියතුමන් භාග්‍යවරයට එසවීමට මෙරටට වැඩම කළේය.

එදා සවැනි පාවුළු සසුන් පියාණන්ට මෙරටට වැඩම කරන්නට රජයක් ලෙස නිල වශයෙන් ආරාධනා කළේ ඩඩ්ලි සේනානායක මහතා අගමැති ධූරය දැරූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි (1965-1970). ලෝක රාජ්‍ය නායකයකු වන ශුද්ධොත්තම පියතුමා යම් රටකට පැමිණීමේදී එම රටේ රජයෙන් නිල ආරාධනාවක් ලැබීම මූලික අවශ්‍යතාවයක් වන අතර අදාල රටේ කතෝලික රදගුරු සම්මේලනයේ නිල ආරාධනාවට පසු අදාල රටේ රජයෙන්ද ඊට ආරාධනා කිරීම නිල පිළිවෙත වී තිබේ. ඉන් පසු කලෙක වන්දනීය ජුසේවාස් පියතුමා භාග්‍යවරයට එසවීම මුල් කරගෙන අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධොත්තම පියතුමාට සිරිලකට වැඩම කරන්නැයි එවකට පැවැති එක්සත් ජාතික පක්ෂ රජය - ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ අනුමතිය ඇතිව ශුද්ධාසනයට ආරාධනා කළේය. ඉන් පසුව 265 වැනි සසුනිසුරාණන් වූ අති උත්තම සොළොස්වන බෙනඩික් සසුන් පිය සමයේදී මෙරට කතෝලික රදගුරු සම්මේලනය එතුමන්ට මෙරටට වැඩම කරන්නැයි ආරාධනා කළ බවට වාර්තා පළ වුවද මෙරටට සැපත් වීමට එතුමන්ට අවකාශ ලැබුණේ නැත. මේ අනුව 2013 මාර්තු 13 වැනිදා ශුද්ධාසනයේ 266 වැනි සසුන් එඬේරාණන් ලෙස රෝමයේ සිස්ටයින් දෙව්මැඳුරේ සසුන් පිය පදවි ප්‍රාප්ත වූ අතිඋත්තම හොර්හේ මාරියෝ කාදිනල් බර්ගෝලියෝ හිමිපාණන්ගේ සසුන් පිය නිලවරණයට සහභාගි වූ කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් එතුමන්ට සුබ පතන්නට ගිය මුල් අවස්ථාවේදීම ශ්‍රී ලංකාවට වැඩම කරන්නැයි කළ ඇරියුම පසුව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය වඩාත් නීත්‍යානුකූල මට්ටමින් ඉදිරිපත් කිරීමෙන් පසු මෙරට පැවැති එක්සත් ජනතා නිදහස් සංධාන රජය රාජ්‍ය මට්ටමින්ද, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති වශයෙන්ද එතුමන්ට ඇරියුම් කළ බව නොරහසකි.

අතිඋත්තම සවැනි පාවුළු ශුද්ධොත්තම පියතුමාට මෙරටට වැඩම කරන්නැයි ආරාධනය කළ ඩඩ්ලි සේනානායක මහතාගේ එක්සත් ජාතික පක්ෂ රජය 1970 පැවැති මහ මැතිවරණයෙන් පරාජයට පත්වීම නිසා බලයට පත්වූ සමගි පෙරමුණු ආණ්ඩුව වෙනුවෙන් එහි අගමැතිනිය සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය අතිඋතුම් සවැනි පාවුළු සසුන් පියාණන් පිළිගැනීමේ අවස්ථාවට එක්වූවාය. ඉන් විසි පස් වසරකට පසු 1995 දී අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සුදුතුම් පියා මෙරටට වැඩම කරද්දී බලයේ සිටියේ පොදු පෙරමුණු ආණ්ඩුවයි. එතුමන්ට මෙරටට වැඩම කරන්නැයි නිල වශයෙන් ඇරියුම් කළ එක්සත් ජාතික පක්ෂය 1994 දී පැවැති තෙවැනි ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වීම නිසා බලයට පත්වූ පොදු ජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියත්, එහි අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියත්, අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියාණන් පිළිගැනීමේ අවස්ථාවට එක්වූහ. ඉන් විසි වසරකට පසු 2015 දී මෙරටට සැපත්වූ අතිඋත්තම ප්‍රැන්සිස් සසුන් පියා පිළිගැනීමේ අවස්ථාවට එක්වූයේද එතුමන්ට මෙරටට වැඩම කරන්නැයි නිල වශයෙන් ආරාධනා කළ එක්සත් ජනතා නිදහස් සංධාන ආණ්ඩුව හෝ එහි ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා නොව 2015 ජනවාරි 08 වැනිදා පැවැති මෙරට සත්වන ජනාධිපතිවරණයෙන් ජය ලබා මෙරට සවැනි ජනාධිපති ලෙස පත්වූ මෛත්‍රිපාල සිරිසේන මහතා වීම විශේෂ ලක්ෂණයකි.


සා. දෙවන ජුවාම් පාවුළු මුනිතුමා 1995 දී වන්දනීය ජුසේවාස් තුමන් භාග්‍යවරයට එසැවීමට සිරිලකට සැපැත්වූ අවස්ථාව


අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ශ්‍රී ලංකාවේ චාරිකා කරන බව මුල් වරට හෙළි කළ ඉතාලියේ ශ්‍රී ලාංකික සංක්‍රමික රැළියේදී කාදිනල් හිමිපාණන් සමඟ

ජනවාරි 08 වැනිදා සත්වන ජනාධිපතිවරණය පැවැත්වීමත්. ඉන් දින පහකට පසුව සුදුතුම් පියාණන් මෙරටට සැපත් වීමට නියමිතව සිටීමත් නිසා අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පිය ලංකා ගමන අවලංගු කරන්නැයිද, පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුකොටගෙන සසුන් පිය ලංකා ගමනට බාධා ඇතිවේ යැයි උපකල්පනය කිරීමත් හේතුකොටගෙන දින වකවානු වෙනස් කරන්නැයිද මෙරට විවිධ පාර්ශ්වයන් වෙතින් (විශේෂයෙන් සභා අභ්‍යන්තරයෙන්ම) ඇතිවූ විවිධාකාර ඉල්ලීම්, යෝජනා, මතවාද සියල්ල මැද දේවාශිර්වාදය තුළ දේව හස්තයේ නොමඳ රැකවරණය හා ආරක්ෂාව නිසා 2015 අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පිය ලංකා ගමන සෑම සියලු අංශයන්ගේ විශිෂ්ට ලක්ෂණ පිළිබිඹු කරමින් සාර්ථක ලෙස නිමාවට පත්විය.

2013 මාර්තු 13 වැනිදා කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් නව සසුන් පියාණන්ට සිය කීකරු බව පළකරමින් සසුන් පිය නිලවරණය නිමවූ වහාම කළ ආරාධනයෙන් අනතුරුව සියලුම කාදිනල් හිමිපාණන් (වයස අවු. 80 ට වැඩි අයද) සමග දෙදිනකට පසු අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියාණන් නැවතත් හමුවීමට අවකාශ සැලසිණ. ඒ අවස්ථාවේදී ද විශ්‍රාමික අතිඋතුම් සොළොස්වන බෙනඩික්ට් ශුද්ධොත්තම පියතුමා ආසියාකරයට වැඩම කිරීමට බලා සිටියත් ඊට අවකාශ නොලද බව සඳහනට ලක්කරමින් සිරිලකට වැඩම කරන්නැයි නැවතත් ආරාධනා කළ මොහොතේ උන්වහන්සේ එය පිළිගත්හ. ඒ සඳහා නිල ඇරියුමක් කරන ලෙස සසුන් පියා කළ ඉල්ලීම් අනුව පෙරළා මවුබිමට පැමිණි කාදිනල් හිමිපාණන් ශ්‍රී ලංකා කතෝලික රදගුරු මණ්ඩල රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කර මුලින්ම ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය මගින් නිල ආරාධනාවක් ඉදිරිපත් කළේය. එය සිය දෑතින්ම ශුද්ධාසනයට ඉදිරිපත් කළ කාදිනල් හිමි පසුව ශ්‍රී ලංකා රජය මගින් නිල ආරාධනාවක් ද ශුද්ධාසනයට ඉදිරිපත් කැරිණි. අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා සිය ප්‍රථම ආසියාතික චාරිකාව සඳහා දකුණු කොරියාවට සැපත්වන්නට 2014 වසරේදී දින වකවානු යොදා ගත්තද ඒ අවස්ථාවේදී මෙරටට වැඩම නොකර 2015 ජනවාරි මාසයේ පිලිපීනයේ අපෝස්තලික චාරිකාව සමග ශ්‍රී ලංකාවට පැමිණෙන්නට පිඹුරු පත් සකස් කැරෙන බවට තොරතුරු නිල නොවන මට්ටමින් වාර්තා විය.

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ සභාපති කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මෙරට රදගුරු මණ්ඩලය මගින් ඉදිරිපත් කළ නිල ආරාධනාවේදී සසුන් පියාණන්ට මෙරටට වැඩම කරන්නට යැයි කළ ඇරියුමට අමතරව තවත් සුවිශේෂි ඉල්ලීමක් විය. එනම් ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයාණන් වූ භාග්‍යවන්ත ජුසේවාස් තුමන් සාන්තුවරයට එසවීමේ ඒ සුවිශේෂි තිළිණය ද සසුන් පිය ශ්‍රී ලංකා ගමන හා සමාන්තරව සිදු කිරීමට හැකිවන ලෙස භාග්‍යවන්ත ජුසේවාස් පියා සාන්තුවරයට එසවීමට කටයුතු කරන ලෙසයි.

2014 පෙබරවාරි 08 වැනිදා ඉතාලියේ ශ්‍රී ලාංකික ශ්‍රම සංක්‍රමිකයෝ සාන්ත පීතර බැසිලිකාවේදී අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා බැහැදැකීමේ ශ්‍රී ලාංකික දිනයක් සඳහා එක්රොක් වූහ. එහි පැවැති දිව්‍ය පූජාවෙන් පසු ඓතිහාසික සාන්ත පීතර බැසිලිකාවට එක්රොක්ව සිටි දහස් සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන් හමුවේ අතිඋත්තම ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා මුල්වරට සිය ශ්‍රී ලංකා සංචාරය අනාවරණය කළේය.

'ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙස විරුදාවලි ලත් සොබා සිරියෙන් අනූන පින්බිමට පැමිණෙන්නට තමන් වහන්සේ ආසාවෙන් සිටින බව උන්වහන්සේ මුල්වරට එහිදී අනාවරණය කළහ. මේ අවස්ථාවට කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්, හලාවත රදගුරු අතිඋතුම් වැලන්ස් මෙන්දිස් හිමිපාණන්, ඉතාලියේ ශ්‍රී ලංකා සංක්‍රමික ජාතික සම්බන්ධීකාරක මොන්සිංඤෝර් අතිගරු නෙවිල් ජෝ පෙරේරා මාහිමිපාණන්ද එක්ව සිටි අතර අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා ශ්‍රී ලංකාවට වැඩම කරන බවට නිල ප්‍රවෘත්තිය ලොව පුරා පැතිර ගියේය.

ඒ වනවිට 2015 ජනවාරි මාසයේ එතුමනට මෙරටට සැපත් වන්නට කිසිදු බාධාවක් ජාතික මට්ටමෙන්වත්, සමාජීය හෝ දේශපාලන මට්ටමින්වත් මතුව තිබුණේ නැත. ඒ නිසාමදෝ ශ්‍රී ලංකා රජයද මේ චාරිකාව හිස් මුදුනින්ම පිළිග නිමින් එය පූර්ණ රාජ්‍ය අනුග්‍රහය සහිතව සිදුකිරීමට කැමැත්ත පළ කළේය.

මේ අතර භාග්‍යවන්ත ජුසේවාස් තුමන් සාන්තුවරයට එසවීම සඳහා වන කටයුතු නිමකර ගැනීමට අදාල වාර්තා සකස් කර මෙරටින් යවා තිබුණද සාන්තුවර භාවයට එසවීම සඳහා සොයා බලන සසුන් නියෝජනයට ඒවා ඉදිරිපත් වී නැති අන්දමත්, පුරා වසර 1 1/2 කට ආසන්න කාලයක් තිස්සේ අදාල වාර්තා හා ලිපි ලේඛන ගමන් බෑගයක සැඟවී ඇති අන්දමත් සොයාගැනීමත් සමග අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මෙරට සහෝදර රදගුරු හිමිපාණන් වෙත වහා කරුණු දක්වා කටයුතු කඩිනම් කිරීමට පියවර ගැනීමෙන් සිදුවන්නට ගිය අකරතැබ්බක් වලක්වා ගැනීමට හැකිවිය.

මේ ආකාරයෙන් අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා ලංකා ගමනට අදාල කටයුතු පෙළ ගැසෙද්දී හුදෙක්ම අපෝස්තලික චාරිකාවක් වූ සසුන් පියා මෙරටට සැපත් වීම ජාතික මෙන්ම ජාත්‍යන්තර දේශපාලන කරලියේ ඒ ඒ අංශයන්ගේ අවධානයට ලක්වීමද වැලැක්විය නොහැකි විය. කෙසේ වෙතත් එක්සත් ජනතා නිදහස් සංධාන ආණ්ඩුව 2014 වසරේදී ජනාධිපතිවරණය පැවැත්වීමට තවත් වසර දෙකක කාල වකවානුවක් තිබියදී ජනාධිපතිවරණයක් නිවේදනය කිරීමත් සමග මේ පිළිබඳ කතිකාව විවිධ මං ගත්තේය. අවසානයේදී ජනාධිපතිවරණය ජනවාරි 08 වැනිදා දින නියම වූයේ අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පිය ලංකා ගමන 2015 ජනවාරි 13 සිට 15 වැනිදා දක්වා සිදු කැරෙන බවට මාස ගණනාවකට පෙර ප්‍රකාශයට පත්වී තිබියදීය. මෙරට ව්‍යවස්ථාවට අනුව මැතිවරණ කොමසාරිස් වරයාට පැවරී ඇති බලතල මත සත්වන ජනාධිපතිවරණයට දින වකවානු නියම වුවද එතුමන් විසින් දිනය ප්‍රකාශ කිරීමට මත්තෙන් රාජකීය ජ්‍යොතිෂඥයා දින වකවානු සකසා අවසන් බවටත්, ඒ අනුව ජනවාරි 8 වැනිදා ජනාධිපතිවරණය පැවැත්වෙනු ඇති බවටත් පැතිර ගිය කටකතා සනාථ කරමින් කටයුතු සිද්ධ විය.

15 පිටුවට

Desktop / Pradeepaya-All-Pages / 2011-11-27 Pradeepaya 55

ඥානාර්ථ ප්‍රදීපය

ක්‍රිස්තු වර්ෂ 2015 ජනවාරි 18 ඉරිදා




ජනාධිපතිවරණ ..... 14 පිටුවෙන්

ඒ හා සමඟින් සසුන් පිය ලංකා ගමන ගැන විවිධ කතාබහ පැතිර ගිය අතර එය අවලංගු වු බවටත්, කල් දැමිය යුතු බවටත්, පිලිපීනයට ගොස් ආපසු එන ගමනට දින වෙනස් වූ බවටත් විවිධ තොරතුරු මැද ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත්ව සිටින ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා කැඳවා මේ පිළිබඳව වෙන වෙනම විමසා බලන්නට උත්සුක වූහ. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මෙන්ම පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාද සසුන් පිය ලංකා ගමන කිසිදු බාධාවකින් තොරව පවත්වන්නට සිය සහයෝගය ලබා දෙන්නට කතෝලික රදගුරු හිමිපාණන්ට පොරොන්දු වූහ.

එහෙත් ඇතැමෙක් ඊට එකඟ නොවූහ. සමාජ මාධ්‍ය ජාල, විද්‍යුත් තැපෑල, කෙටි පණිවුඩ පමණක් නොව විවිධ කටකතා හා විමසීම් ආකාර ප්‍රචාර ඔස්සේ ද සසුන් පිය ලංකා ගමන කල්දැමීමට - අවලංගු කිරීමේ විවිධ වෑයම් මැද ඒ සියලු ප්‍රයත්න ව්‍යර්ථ කරමින් අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියා සැලසුම් කළ පරිදි සිරිලක් බිමට පා තැබීය. දේව හස්තයේ බලය දේව සංරක්ෂණයේ ශක්තිය වෙනුවට විවිධ න්‍යාය පත්‍රයන්, පටු අරමුණු පෙරටු කර ගැනීමට දැරූ වෑයම් ව්‍යර්ථ කරමින් අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියා මෙරටට සැපත් විය.

## සසුන් පිය ලංකා ගමනට නව කාසියක්






අතිඋතුම් ප්‍රන්සිස් ශුද්ධොත්තම පිය සිරිලක් චාරිකාව නිමිත්තෙන් රු. 500 වටිනාකමැති විශේෂ කාසියක් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කර තිබිණ. එය රනිල් වික්‍රමසිංහ මහතා සසුන් පියාට පිළිගැන්විය.

## නව මුද්දරයක් සහ මුල් දින කවරයක් නිකුත් වේ



සසුන් පිය චාරිකාව නිමිත්තෙන් විශේෂ මුද්දරයක් මෙන්ම මුල් දින කවරයක්ද ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවැති උලෙළේදී නිකුත් වූ අතර එය මුදල් අමාත්‍ය රවී කරුණානායක මහතා ජනාධිපතිවරයාට භාර දීමෙන් පසු ඒ මහතා සසුන් පියා වෙත පිළිගැන්විය.

## අතිඋත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ජනාධිපති කාර්යාල සමරු පොතේ තැබූ සටහන



"ආදරණීය ශ්‍රී ලංකා ජනතාවට සේවය කරන්නට ධෛර්යය, බුද්ධිය සහ අවබෝධය යන ශුද්ධාත්ම තිළිණයන් ලබාදෙන මෙන් මම දෙවියන් වහන්සේට යාච්ඤා කරමි. සාමය, සංහිඳියාව සහ සහජීවනය පතමි."

✠ ප්‍රැන්සිස්

## සුදුතුම් පිය ගමන නිමිත්තෙන් සිරකරුවන් හත්සියයකට නිදහස හිමිවේ




අති උත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ ශ්‍රී ලංකා සංචාරය නිමිත්තෙන් ජනාධිපති විශේෂ පොදු සමාව යටතේ සිරකරුවන් 700 කට නිදහස ලබා දුන් බව පැවසේ. දරුණු අපරාධ චෝදනා 27 ක් යටතට නොගැනෙන සුළු චෝදනා යටතේ කෙටිකාලීන සිර දඬුවම් විඳින සිරකරුවන්, දඩ මුදල් ගෙවා ගත නොහැකිව සිරගත වූ සිරකරුවන්ට නිදහස ලැබෙන අතර අවුරුදු 75 ට වැඩි කාන්තා පිරිමි සිරකරුවන් දරුණු අපරාධ චෝදනා යටතේ සිර දඬුවම් නොලබන්නේ නම් ඒ අයටද නිදහස හිමිවිය.

## ගාලුමුවදොර පිටියේ දේව මෙහෙයට ලක්ෂ පහකට වැඩි පිරිසක්

භාග්‍යවන්ත ජුසේ වාස් තුමන් සාන්තුවරයට එසැවීම සඳහා ගාලුමුවදොර පිටියේදී පැවැති ඓතිහාසික කතෝලික දේව මෙහෙය සඳහා ලක්ෂ පහකට අධික සැදැහැවතුන් පිරිසක් එක්රොක් වී සිටි බව වාර්තා වේ. ජනවාරි 14 වනදා පෙරවරුවේ පැවැති දේව මෙහෙය සඳහා ජනවාරි 13 දා පටන් ජනතාව ගාලුමුව දොර පිට්ටනියට එක් රොක් වූ අයුරු දක්නට ලැබිණි.

පවුල් පිටින් අතීතයේ වන්දනා ගමන් යන ආකාරය සිහිගන්වමින් ගාලුමුවදොර පිටිය කරා පා ගමනින් පැමිණි දසුන අගනුවර කොයි කාටත් කලකට අමතක නොවන සිද්ධියකි. ජනවාරි 14 දා අළුයම් කාලයේ පටන් මහා ජනසන්නිපාතයකින් ගාලුමුවදොර පිටිය උතුරා ගලා යන්නට පටන් ගැනීමත් සමඟ ආරක්ෂක අංශයට සහ සංවිධායක මණ්ඩලවලට අවැසි පහසුකම් සපුරාලීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවූ බවක් දක්නට ලැබුණි.

අති උත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියා විවෘත ජීප් රියක නැගී ගාලුමුවදොර පිටියට පැමිණි අතර උන්වහන්සේ ජනතාව මැදින් ගමන් කරද්දී සැදැහැවතුන් සිය දැත් වල හොවා සිටි කොඩි වනමින් ඔල්වරසන් හඬ දුන්නේ මහත් බැතියකිනි. මේ ගමන අතරවාරයේ දී කුඩා දරුවන්, ආබාධිතයින් වෙත වෙසෙස් සැලකිල්ලක් දක්වමින් ශුද්ධෝත්තම පියතුමා ඔවුන් සිප වැළඳ ගනිද්දී ජනතාව අත්පුඩි සලමින් උන්වහන්සේට ආචාර සමාචාර දැක්වූහ. කොළඹ නගරාධිපති මොහොමඩ් මුසම්මිල් මහතා දේව මෙහෙය ආරම්භ කිරීමට ප්‍රථම කොළඹ නගරයේ යතුර සංකේතාත්මකව සුදුතුම් පියාණන්ට බාර දෙනු ලැබූ අතර ඉන් අනතුරුව සසුන් පියා දේව මෙහෙයට සූදානම් වීම සඳහා කාමරය තුළට පිවිසියේ ය. දේව මෙහෙයේ දී මහනුවර රදගුරු ජුසේවාස් ලේකම් කාර්යාංශයේ අධිපති අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් භාග්‍යවන්ත ජුසේ වාස් තුමන් සාන්තුවරයට එසැවීමේ පිළිවෙත සිදු කිරීමට අවසර පතා සිටියේ ය. මෙහෙයේදී ගෝව අගරදගුරු හිමිපාණන් භාග්‍යවන්ත ජුසේ වාස් තුමන්ගේ චරිතාපදානය ඉදිරිපත් කළ අතර සියලු සාන්තුවර ප්‍රාර්ථනාව උච්චාරණයෙන් පසු ශුද්ධෝත්තම පියතුමා විසින් සාන්තුවර පිළිවෙත සිදුකරන ලදි. ඒ සමඟින් සැදැහැවතුන් අත්පොළසන් දෙමින් ප්‍රීතිය පළ කළ අතර කොළඹ අගරදගුරු වසමේ ආසන දෙව්මැඳුර වූ කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ සුවිශේෂී සීනු මංගල අවස්ථාව සනිටුහන් කරමින් නද දෙන්නට පටන් ගත්තේය.

සා. ජුසේ වාස් මුනිඳුන්ගේ ගීතිකාව ගායනා කළ අතර රදගුරු හිමිපාණන් සසුන් පියාට තුති පිදීම ද මෙහිදී සිදුකෙරිණි. අති උත්තම ප්‍රැන්සිස් සුදුතුම් පියතුමා ගෝව අගරදගුරු හිමිපාණන්ට හා මහනුවර රදගුරු හිමිපාණන්ට මෙහිදී ආචාර කළ අතර කොළඹ අගරදගුරු අති උත්තම මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ තුති පිදීමේ දෙසුම ඉදිරිපත් කළහ.

මෙම දේව මෙහෙයට සහභාගි වූ සැදැහැවතුන් සඳහා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීමට පූජා ප්‍රසාදින් වහන්සේ පන්සියයකට අධික පිරිසක් සහභාගි වූ බවත් ඔස්ති ලක්ෂ 5 කට ආසන්න ප්‍රමාණයක් යොදා ගෙන ඇති බවත් වාර්තා වේ. දිව්‍ය පූජා යාගය සඳහා මෙරට මෙන්ම එතෙරින් පැමිණි පූජා ප්‍රසාදින් වහන්සේ 1500 කට අධික පිරිසක් සහභාගි වූ අතර පැවිදි සොයුරියන් 3000 කට වැඩි පිරිසක් එක් වූහ.

ශ්‍රී ලංකා ඉතිහාසයේ දිව්‍ය පූජා යාගයක් සඳහා වැඩිම ඔස්ති ප්‍රමාණයක් යොදා ගැනීමට සිදුවූයේ භාග්‍යවන්ත ජුසේ වාස් තුමන් සාන්තුවරයට එසැවීමේ මෙම දිව්‍ය පූජා යාගයට වන අතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දීම සඳහා උපයෝගී කරගෙන ඇති විශේෂ කුඩ විශාල ප්‍රමාණයක් භාවිත වූ බවද වාර්තා වේ. දිව්‍ය පූජා යාගයෙන් පසු ගුවන් හමුදාව සහ නාවික හමුදාව ඒකාබද්ධ විශේෂ සංදර්ශනයක් පවත්වනු ලැබූ අතර ඊට පෙර අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පාප් වහන්සේගේ අපෝස්තලික ආශිර්වාදය ලබා ගන්නා අවස්ථාවේදී බැතිමතුන් ජපමාල, බොරලික්කම්, ඡායාරූප, යාච්ඤා පොත් ඉහළට ඔසවා ආශිර්වාදය ද ලබා ගත්හ.

## සුදුතුම් පියතුමා පිලිපීනයේ මැනිලා නුවරට සැපත් වේ

පිලිපීනයේ මැනිලා නුවර බලා පිටත්ව ගිය අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ජනවාරි 15 දා මැනිලා වේලාවෙන් ප.ව. 5.31 ට එරටට ළඟා වූ බව විදෙස් පුවත් සේවා වාර්තා කළේය.

පුරා දින හතරක් එරට රැඳී සිටින ශුද්ධෝත්තම පියතුමා සිය පිලිපීන චාරිකාවේදී වෙසෙස් අවධානයක් දිළිඳුන් හා පීඩිතයන් වෙත යොමු කරන්නට බලාපොරොත්තු වන බව පැවසීය. ශ්‍රී ලංකාවේ කටුනායක සිට පැය 6 1/2 ක ගුවන් කාලයක් මේ සඳහා ගත විය.

